2023

වාර්ෂික කාර්ය සාධන වාර්තාව


வருடாந்த செயற்றிறன் அறிக்கை

Annual Performance Report

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

அரசாங்க தகவல் திணைக்களம்

Department of Government Information



වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

නො.163, කිරුළපන මාවත,
පොල්හේන්ගොඩ,
කොළඹ 05.

2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය : 210

2020.01.30 දින රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දෙන ලද ආකෘති පත්‍රය ප්‍රකාරව මෙම වාර්තාව සකස් කොට ඇත.

අන්තර්ගතය

	පටුන	පිටුව
පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	07 - 18
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	19 - 25
පරිච්ඡේදය 03-	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	27 - 50
පරිච්ඡේදය 04-	කාර්ය සාධන දර්ශක	51 - 54
පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	55 - 58
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	59 - 63
පරිච්ඡේදය 07-	අනුකූලතා වාර්තාව	65 - 78
	අවසානය	79 – 80

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3. ප්‍රධාන කාර්යයන්

1.4. සංවිධාන සටහන

1.5. දෙපාර්තමේන්තුවේ අංශ / ඒකක

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන / අරමුදල්

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අ). ව්‍යාපෘතිය

ආ). දායක නියෝජිතායතනය

ඇ). ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු.මි.

ඈ). ව්‍යාපෘති කාල සීමාව

1.0 රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

1.1. හැඳින්වීම

බ්‍රිතාන්‍ය යටත් විජිතවාදී පාලන සමයේ දෙවන ලෝක යුද්ධ කාල පරිච්ඡේදයේදී යුද තොරතුරු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා "War Information Centre"නමින් ආයතනයක් ක්‍රියාත්මක විය.

ලෝක යුද්ධය නිමා වීමත් සමඟ යුද තොරතුරු මධ්‍යස්ථානය, රජයේ සංවර්ධන කාර්භාරය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා "රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව" නමින් අලුත් ආයතනයක් ලෙස 1948 ජූලි මස 31 වැනිදා සෝල්බරි කොමිෂන් සභාවේ උපදෙස් හා නිර්දේශ මත කොළඹ ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ පළමු වතාවට ස්ථාපනය කෙරිණ. ආරම්භයේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,

1. ප්‍රවෘත්ති සැපයීම් අංශය
2. ආණ්ඩුවේ පොත්පත් ආයතනය
3. ආණ්ඩුවේ චිත්‍රපට අංශය යන අංශ තුනෙන් සමන්විත විය.

රජය ඉටු කරන ජාතික සංවර්ධන කාර්යභාරය ජනතාව අතරට ගෙන යාම සඳහා ප්‍රධාන කාර්යයන් තුනක් මුල් කරගෙන, ප්‍රධාන අංශ තුනක් යටතේ ස්ථාපිත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ එම ප්‍රධාන කාර්යයන් බවට පත් වූයේ,

01. රජයේ සංවර්ධන ප්‍රවෘත්ති හා ප්‍රචාරක කටයුතු මෙහෙයවීම
02. රජයේ නිල ප්‍රකාශන ජනතාව අතරට ගෙනයාම (මුද්‍රණය හා බෙදා හැරීම)
03. රජය ඉටු කරන ජාතික සංවර්ධන කාර්යභාරය පිළිබඳව ගම්
    මට්ටමින් ජනතාව දැනුවත් කිරීම සඳහා රජයේ චිත්‍රපට අංශය විසින් වාර්තා
    චිත්‍රපට නිපදවා ප්‍රදර්ශනය කිරීම

ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ සිට ආයතනයේ එක්, එක් අංශ වරින්වර, තැනින් තැන ස්ථාපනය කර තිබේ. ඒ අතර ජාවත්ත වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල, මොරටුව පොල්වත්තේ වෙලෝනා ගොඩනැගිල්ල, කොටුව ට්‍රාන්ස්වර්ක් මන්දිරය, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත - අතපත්තු ගොඩනැගිල්ල දැක්විය හැකිය. 90 දශකයේ දී කොල්ලුපිටිය පෞද්ගලික ගොඩනැගිල්ලක මහල් දෙකක පවත්වාගෙන ගිය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව එවකට රජයේ චිත්‍රපට අංශය පවත්වා ගෙන ගිය පොල්හේන්ගොඩ පරිශ්‍රයට ගෙනැවිත් තිබේ. එතැන් සිට එම පරිශ්‍රයේ නව ගොඩනැගිලි ඉදිකරමින් ආයතනයේ විවිධ අංශ එකම පරිශ්‍රයකට ගෙන ඒමට ආයතන ප්‍රධානීන් කටයුතු කර ඇත.

එහි ප්‍රතිඵලයක් ලෙස මනා සේවයක් ඉටුකිරීම සඳහා කාර්ය මණ්ඩලයට ලබා දෙන ත්‍යාගයක් ලෙස එම පරිශ්‍රමයේම ආයතනයේ යටිතල පහසුකම් සවිමත් කරමින් ඉදිකරන ලද පස් මහළින් යුත් නව මාධ්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට 2012 මාර්තු 30 වැනිදා සුබ මොහොතින් ගෙවදින ලදි.

වර්තමානයේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ධුරය දක්වා ආයතන ප්‍රධානියාගේ තත්ත්වය උසස් වී ඇති නමුත් ආරම්භයේදී එම තනතුර ප්‍රවෘත්‍යාධිකාරී නම් විය. 1948 ආරම්භක ප්‍රවෘත්‍යාධිකාරී වූයේ පී. නඩේශන් මහතාය. ප්‍රවෘත්‍යාධිකාරී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දක්වා ආයතන ප්‍රධානී තනතුර උසස් වී තිබේ.

මෙකී කාර්යභාරය ඉටු කිරීම සඳහා පළපුරුදු, දක්ෂ ජනමාධ්‍යවේදියෙකු මෙන්ම පුවත්පත් කතුවරයෙකු වූ එච්.ඒ.ජේ. හුළුගල්ල මහතා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රවෘත්ති නිලධාරියා ලෙස පත් කරනු ලැබීය. එසේම සහකාර ප්‍රවෘත්ති නිලධාරීන් ලෙස පී.එන්. මැද්දේගොඩ, එල්.ආර්.ගුණතිලක, එස්.පී.වෙත්තසිංහ, පී.බී.විජේසිංහ යන මහත්වරුන් කටයුතු කර තිබේ.

එවකට රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ධුරය හෙබවූ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය, ආචාර්ය සරත් අමුණුගම මහතාගේ සංකල්පයක් මත ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රකාශනයක් වන “දෙසතිය” සඟරාවේ මංගල කලාපය 1978 පෙබරවාරි 4 වැනිදා එළි දුටුවේ ශ්‍රී ලාංකේය ජනසන්නිවේදන ක්ෂේත්‍රයේ හැරවුම් ලක්ෂයක් ලෙසිනි. එය දිගු කාලයක් තිස්සේ තීරණාත්මක සන්ධිස්ථාන පසුකර අඛණ්ඩව ජන මනස පෝෂණය කරමින් සිටින මුද්‍රිත මාධ්‍යයකි.

“සක්වල අතැඹුලක්” කළ දෙසතිය විසින් පෝෂණය වූ ලේඛක පරම්පරාව බොහෝය. පාඨක පරම්පරාව ද බොහෝය. මෙරට ප්‍රතිපත්ති තීන්දු කරන්නාගේ සිට ගොවියා, කම්කරුවා දක්වා නියෝජනය කරන ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයෙන් හඳුන්වා දුන් එකම පුවත් සඟරාව වන්නේ ද “දෙසතිය” යි. විශේෂයෙන්ම රජයේ ප්‍රතිපත්ති හා සංවර්ධන වැඩපිළිවෙල ජනතාගත කිරීමේ ප්‍රධාන වගකීම උරට ගත් දෙසතිය ඉන් ඔබ්බට ගොස් ජන මනසේ බුද්ධිමය විප්ලවයක් ඇති කිරීමට සමත් විය. සමාජීය, ආර්ථික, සංස්කෘතික, කලා, ජාත්‍යන්තර සහ තවත් බොහෝ ක්ෂේත්‍ර පිළිබඳ තොරතුරු ඉතාමත් සරල බස් වහරකින් පාඨක රුචිය වඩවන ලෙස ඉදිරිපත් කිරීමට දෙසතිය සඟරාව සමත් වී තිබේ.

දෙසතියට අමතරව “තොරතුරු” නමින් සතිපතා පුවත්පතක් ද, “Alliance” නමින් ඉංග්‍රීසි පුවත්පතක් ද එකල පල කර තිබේ.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අනුමත කාර්යය මණ්ඩලය 220 ක් වන අතර ඊට අමතරව ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයෙන් පැමිණි නිලධාරීන් 40 ක් හා 2022 සංවර්ධන නිලධාරී පත්වීම් ලද නිලධාරීන් 70ක් සේවය කරයි. ඒ අනුව 2023.12.31 ට සමස්ත කාර්යය මණ්ඩලය 330 කි.

රජයේ ආයතන අතර ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සුවිශේෂී වැදගත්කමක් හිමි කර ගන්නේ සෘජුවම මහජනතාවට පුවත් සපයන මාධ්‍ය ආයතන සමග සම්බන්ධ ආයතනය නිසාවෙනි. ඉන් නිකුත් කෙරෙන නිවේදනයක් රජයේ නිල නිවේදනයක් වන්නා සේම එය අතිශයින් නිවැරදි තොරතුරුවලින් සමන්විත විය යුතුමය.

එසේ පුවත් සපයන අතර එක්, එක් වකවානුවලදී රජය ගන්නා තීරණ අනුව කටයුතු කිරීමට ද සිදු වී ඇත. 1979, 1980, 1981, 1983,1987,1995,1996 හා 2000 යන වර්ෂවලදී රජය පුවත් වාරණය කළ අතර, එම අවස්ථාවල රටේ කලබලකාරී වාතාවරණයක් පැවතීම ඊට හේතු විය. එවැනි අවස්ථාවලදී පුවත් වාරණය රජයේ නිසි බලධරයා ලෙස ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයාට පැවරුණු රාජකාරියක් විය.

1993 දී රාජ්‍ය නොවන රූපවාහිනී නාලිකාවන්ට ප්‍රථම වරට ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමට රජය අවසරදීම මෙරට මාධ්‍ය ඉතිහාසයේ වැදගත් සිදුවීමක් ලෙස සැලකිය හැකි වේ. මීට සමගාමීව මහජනයාට අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා 1995 මැයි 18 වැනිදා ජාතික තොරතුරු මධ්‍යස්ථානය බිහි කිරීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තවත් එක් ඉදිරි පියවරක් විය. එම මධ්‍යස්ථානය කොළඹ කොටුව, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ ආරම්භ කෙරිණි. ඒ සමඟම මාධ්‍යවේදීන් අතර සුහදත්වය වර්ධනය කිරීම සඳහා “Press Club” එහි පිහිටුවන ලදි.

ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයෙන් දෙපාර්තමේන්තුව හදිසියේ ඉවත් කරන ලද අතර, පසුව කොල්ලුපිටියේ පෞද්ගලික ගොඩනැගිල්ලක මහල් දෙකකට ආයතනය ගෙන ගොස් තිබේ.

රාජ්‍ය ජනමාධ්‍ය ව්‍යුහයේ පැවති සීමා හඳුනාගෙන ජනතාව වඩාත් සංවර්ධන කාර්යභාරයට දායක කර ගැනීම රජයේ අරමුණ වූයෙන්, විශේෂයෙන් රජයේ කෘෂි කාර්මික නවෝදය, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම, සර්වජන ජන්දබලයේ ජනතා මෙහෙවර යනාදී කරුණු පිළබඳව ජනතාව දැනුවත් කිරීමේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට පැවරුණු වගකීම වඩාත් සාර්ථකව ඉටු කිරීමට රජයේ චිත්‍රපට අංශය, ප්‍රකාශන කාර්යාංශය ඉතා පුළුල් මෙහෙවරක් ඉටු කර තිබේ.

ආරම්භක යුගයේ සිටම රජයේ ප්‍රචාරන වැඩපිළිවෙළ දේශීය වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් ද ඉටු කළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ විදේශ තානාපති කාර්යාල ඉලක්ක කර ගෙන අත්පත්‍රිකා, සඟරා හා ප්‍රකාශන නිතිපතා බෙදා හැරීමට ද කටයුතු කර තිබේ. මෙම කාල පරිච්ඡේදයේදී විදේශ තානාපති කාර්යාල ඉලක්ක කර ගෙන පළ කරනු ලැබූ “Week Happening in the Island” සඟරාවද “Introduction Ceylon” ආදී ප්‍රකාශන තුළින් ශ්‍රී ලංකාව පිළිබඳව විශේෂ තොරතුරු විදේශ රටවලට ලබා දීමට කටයුතු කර තිබේ. පසු කාලයේදී ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු විදේශයන්හි ප්‍රචාරය කිරීම සඳහා “Sri Lanka Today” නමින් ත්‍රෛමාසික සඟරාවක් ද පළ කර තිබේ.

රජයේ ප්‍රකාශන කාර්යාංශය ද ඉතා පුළුල් අරමුණක් යටතේ පවත්වාගෙන යමින් රජයේ නිල ප්‍රකාශන පිළිබඳව නීති, අණපනත් මහජනතාවට මිලදී ගැනීම සඳහා මුද්‍රණය කර බෙදා හැරීමට කටයුතු කර තිබේ. මෙහි ආරම්භක නිලධාරියා ලෙස සේවය කර ඇත්තේ R.V.H. Vantwest මහතාය.

ජුලියෝ පෙට්ට්‍රෝනි මහතාගෙන් ආරම්භ වූ රජයේ චිත්‍රපට අංශය, නිදහසින් පසු මෙරට සිදු වූ ජාතික සංවර්ධනය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා සුවිශාල මෙහෙවරක් ඉටු කර ඇත. ඒ වාර්තා චිත්‍රපට නිෂ්පාදනය මගිනි. පසුකාලීනව කීර්තිමත් වාර්තා චිත්‍රපට අධ්‍යක්ෂවරුන් රාශියක් බිහි කළ මෙම අංශය, පැරිස් ජාත්‍යන්තර චිත්‍රපට උළෙල ආදී විදේශ සිනමා සම්මාන උළෙල රාශියකදී වාර්තා හා අර්ධ වාර්තා අංශයෙන් ශ්‍රී ලංකාවට සම්මාන දිනා දී ඇත.

1948 නිදහසත් සමග ඇති කරන ලද දෙපාර්තමේන්තු ආකෘතිය යටතේ යාහැකි උපරිමය දක්වා යන, සිය ගමන් මගේ එදාට වඩා පසුගිය වර්ෂවල නවීන ලෝකයට ගැලපෙන ආකාරයෙන් සංවිධිත වී ඇති රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව 2023 වන විට අංශ කිහිපයකින් සිය සේවාවන් පවත්වා ගෙන යයි. රජයේ චිත්‍රපට අංශය, ඡායාරූප අංශය, රජයේ සමාජ මාධ්‍ය ඒකකය, දෙසතිය සඟරා අංශය, නව මාධ්‍ය ඒකකය (www.news.lk), රජයේ ප්‍රකාශන කාර්යාංශය, මාධ්‍ය හැඳුනුම්පත් අංශය, ප්‍රචාරක අංශය සහ මාධ්‍ය විමර්ශන හා ජනමාධ්‍ය පර්යේෂණ ඒකකය, විදේශ ප්‍රවෘත්ති ඒකකය, පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධන සංවර්ධන ඒකකය යන අංශ හා ඒකකවලින් සමන්විත රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී ආයතනයක් බවට පත් වී ඇත.

මෙම කාර්යභාරය කාලීන වෙනස්කම්වලට ලක් වෙමින් වර්තමානය දක්වාම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යුහුසුළු වනවාක් මෙන්ම පවත්නා යාන්ත්‍රණයන් තුළින් ඒ සඳහා ඉඩ හසර වෙන් කර ගන්නා බවද නිරීක්ෂණයේදී පැහැදිලි වේ.

❖ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන්

1948 සිට රජයේ ප්‍රවාත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් ලෙස ප්‍රවෘත්ත්‍යාධිකාරී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ සහ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු නාම දරමින් පහත නිලධාරීන් කටයුතු කර ඇත.

1948 - පී. නඩේශන් මහතා

1949 - ඩී.අයි.එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා

1950 - වී.ටී.ආර්.විවියන් හොරයින් මහතා

1952 - ඩී.අයි.එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා

1955 - නඩේශන් පරරාජශිංගම් මහතා

1956 - ජී. ලයනල් පෙරේරා මහතා

1957 - ජී.ඩබ්.ඒ.එම්.පෙරේරා මහතා

1958 - ජේම්ස් පෙරේරා මහතා

1959 - ටී.එම්. ජයරත්නම් මහතා

1960 - තිලක් එරංග ගුණරත්න මහතා

1961 - ඩබ්.එල්. ප්‍රනාන්දු මහතා

1962 - එස්.බී. සේනානායක මහතා

1966 - ඩී. අළුවිහාරේ මහතා

1967 - පී.එන්. මැද්දේගොඩ මහතා

1968 - ආචාර්ය එස්.එල්.බී. අමුණුගම

1972 - පී.එච්. ප්‍රේමවර්ධන මහතා

1974 - ඩබ්.ආර්.පී. තිලකරත්න මහතා

1977 - එස්. අනුර ගුණසේකර මහතා

1983 - මානෙල් අබේරත්න මහත්මිය

1990 - කේ.එස්. විමලසේන මහතා

1991 - කේ.ආර්.එල්. විජේවර්ධන මහතා

1992 - මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර

1994 - ආරිය රූබසිංහ මහතා

2003 - කේ.ඒ.බී.ජේ.පී. ජයසේකර මහතා

2004 - ඩබ්.එම්. පියසේන මහතා

2005 - කාන්ති විජේතුංග මහත්මිය

එස්.ඩී. පියදාස මහතා

2006 - වී.පී.කේ. අනුෂ පැල්පිට මහතා

❖ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරුන්

2009.02.01 දින සිට 2010.05.06 දින දක්වා - වී.පී.කේ. අනුෂ පැල්පිට මහතා

2010.05.07 දින සිට 2015.01.08 දින දක්වා - මහාචාර්ය ආරියරත්න ඇතුගල

2015.01.13 දින සිට 2015.05.07 (වැ.බ.) දින දක්වා- කේ.ඩබ්.ටී.එන්. අමරතුංග මහත්මිය

2015.05.08 දින සිට 2017.06.02 දික දක්වා - ආචාර්ය දර්ශනී ගුණතිලක

2016.06.06 දින සිට 2017.09.29 දින දක්වා - ආචාර්ය රංග කලන්සූරිය

2017.10.13 දින සිට 2018.10.26 දින දක්වා - නීතීඥ සුදර්ශන ගුණවර්ධන

2018.10.27 දින සිට 2021.04.07 දින දක්වා - කේ.එම්.ජී.එස්. නාලක කලුවැව මහතා

2021.04.19 දින සිට 2022.09.07 දින දක්වා - මොහාන් සමරනායක මහතා

2022.09.08 දින සිට මේ දක්වා - දිනිත් චින්තක කරුණාරත්න

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

❖ දැක්ම

"නිදහස් හා වගකීමෙන් යුතු මාධ්‍ය සම්ප්‍රදායක් උදෙසා දායක වීම"

❖ මෙහෙවර

"ශ්‍රී ලාංකේය සන්නිවේදන මාධ්‍ය අතර සුහදශීලි පරිසරයක් නිර්මාණය කිරීම හා මාධ්‍ය සංස්කෘතිය නඟා සිටුවීම සඳහා අවශ්‍ය මෙහෙයවීම සිදුකරමින් නිවැරදි තොරතුරු හා රජයේ දැක්ම දැන ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම''

❖ අරමුණු


- ජාතික වශයෙන් වැදගත්වන්නා වූ හා රජයේ ප්‍රතිපත්ති, සැලසුම් හා සංවර්ධන ක්‍රියාවලිය පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම.
- උසස් මාධ්‍ය සංස්කෘතියක් බිහිකිරීම.
- වැදගත් හා කාලීන සිදුවීම්, රජයේ තොරතුරු හා සිදුවීම් ශ්‍රව්‍ය, දෘෂ්‍ය හා මුද්‍රිත මාධ්‍යයන් යොදා ගනිමින් වාර්තාගත කිරීම හා ඒවා සංරක්ෂණය කිරීම.
- මාධ්‍ය ක්ෂේත්‍රයට අවශ්‍ය වන්නා වූ මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම.
- මාධ්‍ය ක්ෂේත්‍රය හා මාධ්‍ය වේදීන්ට අවශ්‍ය පහසුකම් සැපයීම, පුහුණුව ලබා දීම හා අවශ්‍ය අවස්ථාවන්හි දී සුබසාධන කටයුතු සඳහා නායකත්වය දැරීම.

1.3. ප්‍රධාන කාර්යයන්

ඉහල සංවර්ධන මට්ටමක් සහ තිරසාර ඉලක්ක සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික මාධ්‍ය ආයතන සහභාගී කර ගනිමින් සන්නිවේදනයෙන් දායක වීම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වන්නේය.

- අමාත්‍යාංශයන්හි අදාළ තොරතුරු ජනමාධ්‍ය වෙත නිකුත් කිරීම.
- රජයේ සංවර්ධන ක්‍රියාදාමය පිළිබඳව ජනතාව දැනුවත් කිරීම.
- ජාතික වශයෙන් වැදගත් අවස්ථාවන් සහ හදිසි තත්ත්වයන් පිළිබඳව දැනුවත් කිරීම.
- රජයේ සංවර්ධන ප්‍රගතිය පිළිබඳ චිත්‍රපට හා වීඩියෝ දර්ශන මාර්ගයෙන් මහජනතාව දැනුවත් කිරීම.
- රජයේ සංවර්ධන තොරතුරු ඓතිහාසික තොරතුරු හා අනෙකුත් කාලයේ වැදගත්කමක් ඇති තොරතුරු පිළිබඳ ප්‍රවෘත්ති හා වාර්තා වීඩියෝ චිත්‍රපට නිෂ්පාදනය කිරීම.
- පර්යේෂණාත්මක වාර්තා චිත්‍රපට නිෂ්පාදනය.
- විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා දේශීය තොරතුරු විදේශ වලටත්, විදේශ තොරතුරු මෙරට ජනතාවටත් ලබා දීම.
- රජයේ සමාජ මාධ්‍ය ඒකක හා News.lk වෙබ් අඩවිය භාෂාත්‍රයෙන්ම පවත්වාගෙන යාම.
- දෙසතිය සඟරාව, රජයේ සංදේශය හා විමර්ශන සඟරා යාවත්කාලීනව පවත්වාගෙන යාම.
- රජයේ ප්‍රකාශන කාර්යාංශය ක්‍රියාකාරීව පවත්වාගෙන යාම. (දිස්ත්‍රික් ප්‍රකාශන කවුළු 07 ද ඇතුළුව)
- දේශීය හා විදේශීය මාධ්‍යවේදීන් ජාතික මෙහෙවර සහ රාජතාන්ත්‍රික උත්සව සඳහා සම්බන්ධීකරණය
- ප්‍රාදේශීය සංවර්ධන ප්‍රයත්න සහ අමාත්‍යාංශයන්හි නව වැඩ පිළිවෙල ජනතාව අතරට ගෙනයාම සඳහා මාධ්‍ය චාරිකා සංවිධානය කිරීම
- ජාතික වශයෙන් වැදගත් උත්සව වල ප්‍රධාන මාධ්‍ය සම්බන්ධීකාරක වශයෙන් ක්‍රියා කිරීම.
- වෘත්තිය ප්‍රාදේශීය හා විදේශ මාධ්‍යවේදීන් සඳහා හැඳුනුම්පත් නිකුත් කිරීම.
- රේඛීය අමාත්‍යාංශයන්හි මාධ්‍ය ඒකක සමඟ සමීප සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- කාලීන හා ජාතික වශයෙන් වැදගත් වන සිදුවීම් වලට අදාළ පොත් මුද්‍රණය කිරීම (ADB හා UNDB ආදී ආයතන සමඟ සම්බන්ධ වී අවශ්‍ය මූල්‍ය පහසුකම් සලසා ගැනීම)
- ජනාධිපතිවරයාගේ දේශීය හා විදේශීය නිල උත්සවයන්හි මාධ්‍ය ආවරණය මුද්‍රිත, ශ්‍රව්‍ය දෘශ්‍ය වාර්තා වශයෙන් රැස් කිරීම.
- දෛනික භාෂාත්‍රයෙන්ම පලවන පුවත්පත් වාර්තා විශ්ලේෂණය කර ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීම.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
සංවිධාන සැලැස්ම 2023



1.5. දෙපාර්තමේන්තුවේ අංශ / ඒකක

1. පාලන අංශය
2. ගිණුම් අංශය
3. රජයේ චිත්‍රපට අංශය
4. නිෂ්පාදක ඒකකය
5. සංස්කරණ ඒකකය
6. සජීවීකරණ මැදිරි ඒකකය
7. ශබ්ද හා ශ්‍රවණාගාර ඒකකය
8. වීඩියෝ කැමරා හා ආලෝකකරණ ඒකකය
9. ඩිජිටල් සංරක්ෂණ හා රසායනාගාර ඒකකය
10. චිත්‍රපට සංරක්ෂණ ඒකකය
11. ඡායාරූප ඒකකය
12. ප්‍රචාරක ඒකකය
13. මාධ්‍ය සමාජ ඒකකය
14. දෙසතිය හා ප්‍රකාශන ඒකකය
15. දිස්ත්‍රික් මාධ්‍ය ඒකකය
16. මාධ්‍ය හැඳුනුම්පත් ඒකකය
17. ඩිජිටල් හා තොරතුරු තාක්ෂණ ඒකකය
18. රජයේ ප්‍රකාශන කාර්යාංශය, දිස්ත්‍රික් ප්‍රකාශන අලෙවි කවුළු ඒකකය
19. මාධ්‍ය විමර්ශන හා ජනමාධ්‍ය පර්යේෂණ ඒකකය
20. විදේශ ප්‍රවෘත්ති ඒකකය
21. පාසල් මාධ්‍ය සමාජ ප්‍රවර්ධනය සංවර්ධන ඒකකය
22. පුස්තකාලය
23. ප්‍රවාහන ඒකකය
24. පවිත්‍රතා, ආරක්ෂක හා නඩත්තු ඒකකය
25. භාෂා පරිවර්තක ඒකකය
26. අභ්‍යන්තර විගණක
27. ගබඩාව

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන

- දිස්ත්‍රික් ප්‍රකාශන අලෙවි කවුළු
- දිස්ත්‍රික් මාධ්‍ය ඒකක

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති නැත.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

❖ ප්‍රගතිය හා ඉදිරි දැක්ම

සෑම විටම නව තාක්ෂණය උපයෝගී කොටගනිමින් රජයේ නිල පුවත් සන්නිවේදනයේ ප්‍රමුඛයා බවට පත් වීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්මයි.

නවීන තාක්ෂණයත් සමග වර්තමානයේ දෛනික කටයුතු සම්ප්‍රදායික කාර්යන්ගෙන් ඔබ්බට ගිය ඩිජිටල් තාක්ෂණයත් සමග සියලු කාර්ය ඩිජිටල්කරණයට (Digitalization) ලක්වෙමින් කාර්යයන් වඩාත් පහසුවෙන් සිදු කෙරෙන ඩිජිටල් අවකාශය තුළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඉදිරියට පියවර තබමින් සිටියි.

සියලු මාධ්‍ය ආයතන සමග සම්බන්ධීකරණයෙන් ප්‍රවෘත්ති / තොරතුරු සම්පාදන මූලාශ්‍රය ලෙස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව කටයුතු කරන අතර, රජයේ සියලු කාලීන හා සංවර්ධන තොරතුරු රජයේ සහ පෞද්ගලික මුද්‍රිත විද්‍යුත් මාධ්‍ය වෙත ලබාදීමේ රජයේ යාන්ත්‍රණය ලෙස ක්‍රියා කරයි.

එසේම වර්තමානයේ ඩිජිටල් අවකාශය තුළ ජනතාවට විශ්වසනීය තොරතුරු සන්නිවේදනය කිරීමේ ඩිජිටල් වේදිකාව මෙම වසරේ ඉහළ මට්ටමට ගෙනඒමට හැකිවීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂී ජයග්‍රහණයකි.

දෙපාර්තමේන්තුව යටතේ පවතින වෙබ් අඩවි සහ සමාජ මාධ්‍ය ජාලය කඩිනමින් තොරතුරු සන්නිවේදනය කරන ජාලයන් වීම විශේෂත්වයකි.

❖ ඩිජිටල්කරණයේ සුවිශේෂී අවස්ථා

සමාජ මාධ්‍ය ජාලය තුළ බොහෝ අවස්ථාවල සාවද්‍ය තොරතුරු සංසරණය වන බැවින් හැම විටම ජනතාවට ලැබෙන තොරතුරුවල නිරවද්‍යභාවය, විශ්වසනීයත්වය සහතික කිරීම අත්‍යවශ්‍ය වේ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව www.dgi.gov.lk, “Department of Government Information” YouTube නාලිකාව, FaceBook පිටුව, www.news.lk වෙබ් අඩවිය,YouTube නාලිකාව, FaceBook පිටුව හා Twitter (X Crop.) යන සියලු ජාල ඔස්සේ විශ්වසනීය තොරතුරු ජනතාව වෙත සෘජුව සන්නිවේදනය කරයි.

මාධ්‍ය වෙත පහසුකම් සැලසීම		
	වැඩසටහන	**ක්‍රියාත්මක කිරීම**
01	මාධ්‍ය වෙත තොරතුරු සන්නිවේදනය සඳහා cloud අවකාශය භාවිතය	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, මාධ්‍ය වෙත තොරතුරු සම්පාදන මූලාශ්‍රය ලෙස සාම්ප්‍රදායික ක්‍රමයෙන් ඔබ්බට ගොස් වීඩියෝපට, හඬ පට, ඡායාරූප, ප්‍රවෘත්ති නිවේදන සියල්ල සියලු මාධ්‍ය වෙත එකම මොහොතක් තුළ කඩිනමින් ලබා දෙයි
02	දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන සියලුම මාධ්‍ය ආවරණ මාධ්‍ය වෙත කඩිනමින් නිකුත් කිරීම	රජය ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධ සියලු තොරතුරු ඇතුළත් නිවේදන සහිතව වීඩියෝපට, හඬ පට, ඡායාරූප යනාදිය මාධ්‍ය වෙත නිකුත් කරයි පෙර ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් නොතිබුණු අතර, දැන් මනා සම්බන්ධීකරණයෙන් සියලුම මාධ්‍ය ආයතන සහභාගී කර ගැනීමට හැකි වී තිබේ
03	E mail System සකස් කිරීම	මුද්‍රිත, විද්‍යුත්, වෙබ් මාධ්‍ය, නව මාධ්‍ය, විදෙස් මාධ්‍ය ඇතුළු සියලුම මාධ්‍යයන් වෙනුවෙන් 200කට ආසන්න ඊමේල් පද්ධතියක් තුළින් තොරතුරු හුවමාරු කර ගනු ලැබේ
04	සියලුම මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත නිකුත් කිරීම	ලිපිගොනු පාදක කොටගෙන මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම වෙනුවට දත්ත පද්ධතියක් (Data Base) භාවිතයෙන් එය ඉටු කිරීමට සමත් වී ඇත

ජනතාව වෙත සෘජුව තොරතුරු ලබාදීම		
	“Department of Government Information” YouTube විකාශය පවත්වාගෙන යාම	Department of Government Information You Tube නාලිකාව 2019 වසරේ ජනවාරි වන විට අක්‍රිය තත්ත්වයේ ප්‍රේක්ෂකයින් 12 දෙනෙකු පමණක් සිටි අතර, එම වසර අවසන් වන විට 1000කට වැඩි පිරිසක් ඒ සඳහා එක් කර ගැනීමට හැකි වූ අතර 2023 වන විට ප්‍රේක්ෂක සංඛ්‍යාව විශාල වශයෙන් වර්ධනය විය. එහිදී වීඩියෝ පට විවිධ තේමා ඔස්සේ සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබේ. එනම්,INFO News, INFO Highlights, ඇතුළාන්තය (Inside), INFO News Parliament Highlights, Provincial Highlights, Taller, Documentary, Short Video Reel ආදී වශයෙනි. මේ සියල්ල දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂ ජයග්‍රහණයන් වේ. දෙස් - විදෙස් විශාල ජනතාවක් මෙම YouTube නාලිකාව සමග එක්ව සිටින අතර ඉහළ ජනතා ප්‍රසාදයක් ඊට ලැබී ඇත
	“Department of Government Information” FaceBook පිටුව පවත්වාගෙන යාම	මේ වන විට දෙපාර්තමේන්තුවේ Facebook පිටුව සමඟ ඉතා විශාල අනුගාමිකයින් පිරිසක් (Followers) එක්ව සිටිති. අන්තර්ගතය විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සකස් කිරීමට අවධානය යොමු වූ පසු Facebook like, people reached, engage සංඛ්‍යාව දිනෙන් දින ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකි විය. කාලීන හා සංවර්ධන ප්‍රවෘත්ති ඇතුළත් වීඩියෝ පට (You Tube නාලිකාවේ සියලුම වීඩියෝ) නිර්මාණාත්මක post සහ ඡායාරූප කෙටි විස්තරයක් සහිතව මෙහි යාවත්කාලීන කිරීම සිදු වේ. දැන් සතියකට ලක්ෂයට වැඩි reached සංඛ්‍යාවක් පවත්වා ගෙන යාමට හැකි වී තිබේ.

	www.news.lk web අඩවිය	කාලීන හා සංවර්ධන සියලුම ප්‍රවෘත්ති මෙම වෙබ් අඩවිය ඔස්සේ යාවත්කාලීන කිරීම, භාෂා ත්‍රිත්වයෙන්ම සිදු වන අතර පැය 24 පුරා යාවත්කාලීන වන රජයේ නිල පුවත් වෙබ් අඩවිය මෙයයි. මෙම වෙබ් අඩවිය යටතේ Facebook පිටුව, Youtube නාලිකාව, Twitter (X Crop.) පිටු ක්‍රියාත්මක වේ. එසේම කැබිනට් මාධ්‍ය සාකච්ඡාව ඇතුළු විශේෂ මාධ්‍ය සාකච්ඡා සජීවී විකාශය පවත්වාගෙන යාම ආරම්භ කර ඇති අතර ඒ සඳහා ඉහළ ප්‍රතිචාර ලැබෙමින් පවතී.
	දෙසතිය සඟරාව	ජනතාව වෙත කාලීන හා සංවර්ධන මෙන්ම විදෙස් තොරතුරු කැටි කරගත් වසර 44ක ඉතිහාසයකට හිමිකම් කියන දෙසතිය සඟරාව නියමිත පිරිදි, නියමිත දිනට නිකුත් කිරීමට උත්සාහ දරණ ලදි. නමුත් රට තුළ පැවති අර්බුදකාරී වාතාවරණය හමුවේ මාස ගණනාවක් ආයතනයේ වැඩ කටයුතු අඩපණ වුවද නිවෙස්වල සිට රාජකාරී ඉටු කරමින් 2023 වර්ෂය තුළ ඉතා ඉහළ නිමාවකින් හා ප්‍රමිතියකින් යුතුව දෙසතිය සඟරා දොළහක් (12) මුද්‍රණය කර ඇත. දෙසතිය සඟරාව බෙදාහැරීම ලේක්හවුස් ආයතනයට භාර දෙමින් මුළු ලංකාවම ආවරණය වන විධිමත් බෙදා හැරීමේ ජාලයක් ඔස්සේ සඟරාව පාඨකයන් වෙත ලබාදීමට කටයුතු කෙරිණි.
මාධ්‍ය සංරක්ෂිත පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.		
	ඩිජිටල් සංරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීම	දෙපාර්තමේන්තුව සතුව පවතින ඓතිහාසික වැදගත් චිත්‍රපට, වීඩියෝ පට, ඡායාරූප යනාදිය ඩිජිටල් තාක්ෂණයට හැරවීමේ (Convert to Digital) ව්‍යාපෘතියක් ද ආරම්භ කර තිබේ. මේ වන විට පැරණි චිත්‍රපට 467ක් පමණ ඩිජිටල් තාක්ෂණයට convert කර, සංරක්ෂණය කිරීමට කටයුතු යොදා ඇත ඊට අමතරව ඩිජිටල් සංරක්ෂිත පද්ධතිය ස්ථාපනය කිරීම පසුගිය වසරේ සිදු වූ ප්‍රධාන කාර්යයක් වූ අතර එහි විශේෂිත වූ වීඩියෝ පට, ඡායාරූප සංරක්ෂණය කිරීම එදිනෙදා සිදු කෙරෙන කාර්යයක් බවට මෙම වසර තුළ ද පත් කිරීමට හැකිවීම.

- **මාධ්‍ය වෙත තොරතුරු ලබාදීමේ පහසුකම් විධිමත් ලෙස පුළුල් කිරීම**

යහපත් සාමාජ පැවැත්මක් උදෙසා විශ්වසනීයත්වයෙන් සත්‍ය තොරතුරු වාර්තාකරණය උදෙසා මාධ්‍ය ආයතන තොරතුරුවලින් සන්නන්ධ කිරීම කාලීන අවශ්‍යතාවකි. රජයේ සංවර්ධන හා කාලීන තොරතුරු විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ මාධ්‍ය වෙත සන්නිවේදනය කිරීම පිණිස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව Cloud තාක්ෂණය භාවිත කරමින් මාධ්‍ය ආයතන වෙත වීඩියෝ පට, ඡායාරූප, මාධ්‍ය නිවේදන යන සියල්ල කඩිනමින් ලබාදීමේ විධිමත් ක්‍රමවේදය ආරම්භ කර තිබේ.

- **විශේෂ ජයග්‍රහණ,**

1. දෙපාර්තමේන්තුව වෙතින් නිකුත් ලබන දෙසතිය සඟරාව සඳහා ඉදිරි පියවරක් වශයෙන් වෙබ් අඩවියක් හා යෙදවුමක් (App) නිර්මාණය කිරීම.
2. “Department of Government Information” Facebook පිටුව සඳහා අනුගාමිකයින් (Followers) 196,000 සීමාව පසුකිරීම.
3. දිස්ත්‍රික් මට්ටමේ ප්‍රවෘත්ති වාර්තා 7,926 ක් සකස් කිරීම.
4. ගුණාත්මක ජනමාධ්‍ය සංස්කෘතියක් සහ ප්‍රබුද්ධ ජනමාධ්‍ය සාක්ෂරතාවයක් ප්‍රවර්ධනය කිරීම සහ පාසල් මාධ්‍ය සාක්ෂරතාවය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් ජාත්‍යන්තර යුනෙස්කෝවේ උපදෙස්වලට අනුව ජනමාධ්‍ය අමාත්‍යාංශය රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සමග එක්ව දිවයිනේ පාසල් පද්ධතියේ දැනට සක්‍රියව ක්‍රියාත්මක වන පාසල් මාධ්‍ය සමාජ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යටතේ ලියා පදිංචි කිරීම දිස්ත්‍රික් මට්ටමින් ආරම්භ කිරීම.
5. ශ්‍රී ලාංකේය ජාත්‍යන්තර ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සඳහා ජනමාධ්‍ය අමාත්‍යාංශය, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව හා විදේශීය කටයුතු අමාත්‍යාංශය හා ඒකාබද්ධව ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල සහ ශ්‍රී ලාංකික තානාපතිවරුන් ශ්‍රී ලාංකේය ප්‍රතිරූපය ප්‍රවර්ධනය කිරීම සඳහා ඉටු කරන ජාතික සේවාවන් පිළිබඳව විදේශ රටවල ශ්‍රී ලාංකික තානාපතිවරුන් 06 දෙනෙකු සම්බන්ධ කරගනිමින් විදේශ මාධ්‍ය විද්වත් කතිකා වැඩසටහන් 06ක් සිදු කර ඇත.
6. විදේශ මාධ්‍ය සබඳතා අංශය මෙරට විදේශ තානාපති කාර්යාල සමඟ සමීප සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් විදේශ රටවල සංස්කෘතික සන්නිවේදනය සඳහා දායකත්වය ලබා දී තිබේ.
7. විදේශ මාධ්‍ය ආයතන සහ සංවිධානවල වෘත්තීය මට්ටමෙන් සිදු කරන මහජන සබඳතා හා මාධ්‍ය වැඩසටහන් සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.

❖ අනාගත ඉලක්ක

(i) රටේ සියලු පුරවැසියන්ට කාර්යක්ෂමව නිවැරදි තොරතුරු ලබා ගැනීමේ ප්‍රවේශයන් පුළුල් කිරීම.

(ii) රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන සංවර්ධන වැඩසටහන් පිළිබඳ තොරතුරු ජනතාව අතරට ගෙන යාම.

(iii) දෙපාර්තමේන්තු නිලධාරීන් දැනුමෙන් හා අත්දැකීමෙන් සන්නද්ධ කිරීම.

(iv) මාධ්‍ය සාක්ෂරතාවය ඇති කිරීම.

(v) පාසල් මට්ටමින් මාධ්‍ය අධ්‍යාපනය පුළුල් කිරීමට කටයුතු කිරීම.

(vi) මාධ්‍ය විශ්ලේෂණ වාර්තා භාවිතා කරන රාජ්‍ය නිලධාරීන්ගේ තෘප්තිය වැඩිදියුණු කිරීම.

(vii) සංරක්ෂිත මාධ්‍ය ද්‍රව්‍ය අවශ්‍ය පරිශීලකයන්ගේ තෘප්තිය වැඩිදියුණු කිරීම.

දිනිත් චින්තක කරුණාරත්න

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්/ගණන්දීමේ නිලධාරි

03 පරිච්ඡේදය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන

සමස්ත මූල්‍ය කාර්යසාධනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

එස්ඒඒ - එෆ්

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022		සටහන	2023 රු.	තත්‍ය නැවත ගලපන ලද 2022 රු.	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	එස්ඒඒ-1
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		311,417,000	314,704,000	එස්ඒඒ-3
-	තැන්පතු		4,909,612	46,988,583	එස්ඒඒ-4
-	අත්තිකාරම් ගිණුම්		16,318,794	12,869,688	එස්ඒඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**332,645,406**	**374,562,270**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)**		**332,645,406**	**374,562,270**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		4,061	24,215	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ) – (ඇ)		**332,641,345**	**374,538,055**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	

188,195,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	186,883,460	174,632,967	
124,805,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	110,2001008	94,910,133	ඒසිඒ-2(ii)
2,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	7	1,054,041	1,230,942	
-	පොළී ගෙවීම්	8	-	-	
	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
315,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**298,137,509**	**270,774,042**	
	මූලධන වියදම්				
48,300,000	මූලධන වත්කම් පුනරුත්තාපනය හා වැඩි දියුණු කිරීම	10	13,681,599	7,875,266	
30,900,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	19,624,114	16,091,062	
-	ප්‍රාග්ධන මාරු කිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
1,800,000	හැකියා වර්ධනය	14	596,150	1,006,500	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
81,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**33,901,863**	**24,972,828**	
-	තැන්පතු ගෙවීම්		12,452,926	47,339,975	ඒසිඒ-4
-	අත්තිකාරම් ගෙවීම්		14,878,378	14,032,526	ඒසිඒ-5
-	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
-	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**27,331,304**	**61,372,501**	
-	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**359,370,676**	**357,119,372**	
-	2023 දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ=(ඉ-එ)		**(27,331,304)**	**17,418,683**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		(26,729,331)	17,418,683	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			(26,729,331)	**17,418,683**	

2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	2023 (රු.)	2022 (රු.)
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	1.942.927.346	1,834,026,037
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	36,840,254	38,280,670
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**1,979,767,600**	**1,872,306,707**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		36,572,142	30,469,244
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,942,927,346	1,834,026,037
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම	ඒසීඒ-4	268,112	7,811,426
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**1,979,767,600**	**1,872306,707**

පිටු අංක 07 සිට 49 දක්වා ඒසීඒ 1සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 50 සිට 65 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද, මෙම අවසන්

ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදු කර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තා කරන ආයතනය තුළ පවතින බවත්, මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත්, ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන් දීමේ නිලධාරී	ගණන් දීමේ නිලධාරී	ප්‍රධාන ගණකාධිකාරී
වී.පී.කේ.අනුෂ පැල්පිට	දිනිත් චින්තක කරුණාරත්න	කේ.ඒ.ඩී.ඩී.ඒ. කුමාරපේලි
ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය	රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්	ප්‍රධාන ගණකාධිකාරී
2024.02. 28	2024.02. 27	2024.02. 27
වී.පී.කේ. අනුෂ පැල්පිට ලේකම් ජනමාධ්‍ය අමාත්‍යාංශය 163, "ඇසිඳිසි මැදුර", කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ-05.	දිනිත් චින්තක කරුණාරත්න රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව කොළඹ 05.	කේ.ඒ.ඩී.ඩී.ඒ. කුමාරපේලි ප්‍රධාන ගණකාධිකාරී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

එස්සීඒ-සී

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	තත්‍ය	
	2023 රු.	**2022** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		-
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	25,702,000	20,720,059
අග්‍රිම ලැබීම්	311,417,000	314,704,000
අත්තිකාරම් අයකර ගැනීම්	13,975,050	11,365,073
තැන්පතු ලැබීම්	4,909,612	46,988,583
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**356,003,662**	**393,777,714**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	291,904,206	273,192,850
සහනාධාර සහ මාරුකිරීම්	1,054,041	1,230,942
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	3,975,161	43,293,749
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	4,061	24,215
අත්තිකාරම් ගෙවීම්	13,829,160	12,910,426
තැන්පතු ගෙවීම්	12,452,926	47,339,975
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**323,219,556**	**377,992,157**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**32,784,106**	**15,785,557**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-

ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	32,784,106	15,785,557
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**32,784,106**	**15,785,557**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)	**(32,784,106)**	**(15,785,557)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(0)**	**-**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

(1) වාර්තාකරණ කාල පරිච්ඡේදය

2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

(2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

(3) ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

(4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම්, එම වත්කම්, දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

(5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

(6) මුදල් හා මුදල් සමාන දෑ

2023 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකරණ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ඇතුළත් කළ හැක.

තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම ඇස්තමේන්තුවේ % ලෙස
20.06.02.01	වාහන	-	-	-	-
20.06.02.02	අනෙකුත්	0	-	39.87	0
20.02.01.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී	-	-	-	-
20.02.01.99	රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - කුලී - අනෙකුත් කුලී	-	-	-	-
20.02.02.99	පොළිය - අනෙකුත්	1,000	1,000	1521.30	152.13
20.03.01.00	විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම්	1,200	2,000	5,666.55	566.66
20.03.02.99	විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් විවිධ	20	20	19.00	95.00
20.03.03.02	විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම් - අනෙකුත්	-	-	-	-
20.03.99.00	විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	500	500	7,947.15	1589.43
20.05.99.00	වර්තන පැවරීම්, ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම්	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	රු.394,000,000.00	රු.394,000,000.00	රු.298,137,509.00	75.67
ප්‍රාග්ධන	රු.221,000,000.00	රු.221,000,000.00	රු.33,901,863.00	15.34

3.7 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගි කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
01.	ජනමාධ්‍ය අමාත්‍යාංශය	වරිපනම් බද්ධ ගෙවීමට	-	560,844.00	560,844.00	100
		ඔවුන්ගේ බදු අංශය දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම සඳහා විදුලි බිලෙන් 3%ක් ගෙවීමට	-	226,500.00	211,441.25	93
02.	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	ඔවුන්ගේ මුද්‍රණ අංශය දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම සඳහා විදුලි බිලෙන් 25%ක් ගෙවීමට	-	1,812,000.00	1,762,010.35	97
03.	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම පාරිතෝෂිතය අයකර ගැනීම.	-	1,275,865.63	1,275,865.63	100
04.	බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව	කාර්යාල සේවක සේවයේ ශ්‍රේණියේ පත්වීම් භාර ගන්නා ලද බහුකාර්ය සංවර්ධන සහයකයින් වෙනුවෙන් ගෙවීම	-	165,000.00	165,000.00	100
			-	**4,404,209.63**	**3,975,161.23**	**98.97**

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2023 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2023 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	**300,848,000.00**	-	-
9152	යන්ත්‍රෝපකරණ	-	**407,168,018.18**	-	-
9153	ඉඩම්	-	**1,227,750,000.00**	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	**2,328,660.00**	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	**4,832,667.72**	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. CAM/A/DI/FA/2023/36

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2024 නොවැම්බර් 12 දින

Director General's Office Department of Government Information 20 NOV 2024

අධ්‍යක්ෂ ජනරාල්

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154 ව්‍යවස්ථාව පරිදි පාර්ලිමේන්තුව වෙත වාර්තා ඉදිරිපත් කිරීම .

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2023 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව උක්ත ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති විසින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා යොමු කරන ලද වාර්තාවේ භාෂාත්‍රයෙන්වූ පිටපත් මේ සමඟ ඔබගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි.

02. මෙම වාර්තාව ජාතික විගණන කාර්යාලයේ නිල වෙබ් අඩවිය මඟින් ප්‍රසිද්ධියට පත් කරනු ඇත.

කේ.එච්.යූ.ඩී.සරත් කුමාර

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත: ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති - දැ.ස

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ශීර්ෂය 210- රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධි විධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 14 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනා කරණ විගණන වාර්තාව 2024 මැයි 13 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2023 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය

ජාතික විගණන පනතේ 38(1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තිය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟ හැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද. අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ලැබෙන බවට තහවුරුවක් ඇති වීම හා එම වත්කම විශ්වාසනීයව මැනිය හැකි නම් පමණක් දේපල පිරියත හා උපකරණ ලෙස හඳුනාගත යුතු අතර එසේ නොවන අවස්ථා වල දී නැවත තක්සේරු කරන ලද අගය දේපල පිරියත හා උපකරණ ලෙස හඳුනාගත යුතුය. ප්‍රංශයෙන් ආනයනය කරන ලද නමුත් භාවිතයට නොගෙන පැවති වර්ණ රසායනාගාර යන්ත්‍රය දේපල පිරියත හා උපකරණ තුළ ඇතුළත් කර තිබුණි. 2023 දෙසැම්බර් 31 වන විට එම වත්කමේ ප්‍රත්‍යා ගණන වටිනාකම රු. මිලියන 12 ක් ලෙස දක්වා තිබුණු බැවින් එම වටිනාකමින් වත්කම් වල අගය වැඩිපුර දක්වා තිබුණි.	ප්‍රංශ රජයෙන් ණය ආධාර යටතේ ලද ප්‍රංශ ප්‍රෑන්ක් 9,150,000 යුරෝ 1,442,601 ක වටිනාකමින් යුත් Debri වර්ණ රසායනාගාර යන්ත්‍රය එවකට පැවති විනිමය අනුපාතිකය අනුව රුපියල් මිලියන 160 ක පමණ වටිනාකමක් පැවතුණි. දෙපාර්තමේන්තුවේ පිරිවැය හඳුනාගත නොහැකි වත්කම් තක්සේරු කිරීම සඳහා පත් කළ කමිටුව විසින් විවිධ කරුණු පදනම් කර ගෙන මූලික පිරිවැයෙන් සියයට 7.5 ක තරම් ඉතා අඩු වටිනාකමකට තක්සේරු කරන ලදී.	දේපල පිරියත හා උපකරණ වල වටිනාකම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ii)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂ 5 කට වරක්ම ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කිරීමක් කළ යුතු වුවද මූල්‍ය ප්‍රකාශන වල ගොඩනැගිලි වටිනාකම රු. 300,848,000 ක්ද, ඉඩම් වටිනාකම රු. 1,227,750,000 ක්ද දක්වා තිබූ අතර මෙම වත්කම් 2017 වර්ෂයෙන් පසුව තක්සේරු කර වර්තමාන වටිනාකමට ගැනීමට කටයුතු කර නොතිබුණි.	මෙම දෙපාර්තමේන්තුව සතු ඉඩම් හා ගොඩනැගිලි නැවත තක්සේරු කිරීම සඳහා 2023 ජූනි 19 වන දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීමක් කළද රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ උපදෙස් අනුව මූලික වටයේ තක්සේරු වටිනාකම් ගිණුම්ගත කර අවසාන වන තෙක් දෙවන වටයේ තක්සේරු ඉල්ලීම් සඳහා තක්සේරු වාර්තා ලබා නොදෙන බවද දන්වා ඇත. ලබාගත් ණය මුදල සම්බන්ධයෙන් ගෙවීමට කටයුතු නොකිරීම නිසා එම	වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	සේවය හැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු රු.179,740 ක් වූ ණය ශේෂ වර්ෂ 20 ඉක්මවා පැවතියද 2024 අප්‍රේල් 30 විගණිත දිනය වන විටත් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	2024 මාර්තු 12 දින එක් නිලධාරියකුගේ ණය මුදල කපා හැරීමට කටයුතු කරන ලෙස නිර්දේශ ලබා දෙන ලදී. ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතී. අනෙක් නිලධාරියා ණය මුදල ගෙවන ලෙස එම නිලධාරියාට ග්‍රාම නිලධාරි මඟින් දැනුම් දෙන ලෙසත්, ඔහුගේ වත්කම් වාර්තාවක් ලබා දීමට කටයුතු කරන ලෙසත් හොරණ ප්‍රාදේශීය ලේකම් වෙත 2024 අප්‍රේල් 05 දින දැනුම් දෙන ලදී.	ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	එක් වැය විෂයයක සියයට 100 ක්ද, වැය විෂයයන් 13 ක සියයට 62 සිට සියයට 98 ක පරාසයක ඉතිරිවීම් තිබුණි.	දෙපාර්තමේන්තුවේ ගැනීම, වියදම් පාලන චක්‍රලේඛ , අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු පමණක් කිරීම, නිලධාරීන් වැටුප් රහිත නිවාඩු ලබා ගැනීම සහ ස්ථාන මාරුවීම් ලබා නොදීම මේ සඳහා බලපා ඇත.	ඇස්තමේන්තු නිවැරදිව සකස් කල යුතුය.
(ආ)	වැය විෂයන් 04 ක ප්‍රතිපාදනයන් මු.රෙ. 66 මඟින් වෙනත් වැය විෂයන් වලට මාරු කිරීමෙන් පසුවද සියයට 17 සිට සියයට 83 ක පරාසයක ඉතිරිවීම් තිබුණි.	නිලධරීන් වැටුප් රහිත නිවාඩු ලබාගැනීම හා ස්ථාන මාරුවීම්, වියදම් පාලන චක්‍රලේඛ අනුව කටයුතු කිරීම මත මෙම ප්‍රතිපාදන ඉතිරි වී ඇත.	ඇස්තමේන්තු නිවැරදිව සකස් කල යුතුය.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධි විධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2017 නොවැම්බර් 07 දිනැති අංක 22/99 (XXXIII) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 1.3.1	63,402	කාර්යාල හා නිවාස අතර නිල සංචිත ප්‍රවාහන පහසුකම් හිමි නොමැති සංවර්ධන නිලධාරී තනතුරෙහි නිලධාරියෙකුට ප්‍රවාහන පහසුකම් සැපයීම වෙනුවෙන් මාස 04 ක කාලයක් සඳහා 1358 KM ක රු. 63,402 ක ඉන්ධන වියදමක් දරා තිබුණි.	අදාළ අනුමැතිය අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිඛිතව ලබා දී ඇති අතර අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය පෙ.ව. 8.30ට පෙර විවෘත කිරීම සහ ප.ව.6.00 දක්වා විවෘතව තැබීමට අවශ්‍ය බැවින් උපදෙස් අනුව එම ප්‍රවාහනය පහසුකම් ලබා දී ඇත.	රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසේ 9 මඟින් සංශෝධිත, මු.රේ. 371 (5) ඡේදය.	490,280	ත්තකාර්යය අතුරු අග්‍රිමය ලබාගන්නා මාණ්ඩලික නිලධාරියා විසින් එම කාර්යය අවසන් කර දින 10 ක් තුළ එම අතුරු අග්‍රිම පියවිය යුතු වුවත් එකතුව රු.490,280 ක් වූ අත්තිකාරම් 09 ක් දක්වා වූ කාල පරාසයක් ප්‍රමාද කර පියවා තිබුණි.	පියවීම් වවුචරවල පවතින යම් යම් අඩුපාඩු නිසා ඇතැම් අත්තිකාරම් පියවීම් ප්‍රමාද වී ඇත. මෙම තත්ත්වය පාලනය කර ගැනීමට අඛණ්ඩව කටයුතු කෙරෙමින් පවතී.	රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020		වාර්ෂික කාර්ය සාධන වාර්තාව භාෂාත්‍රයෙන් සකස්කර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ගත වීමට පෙර සභාගත කිරීම සඳහා නියමිත විධිවිධාන යටතේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු වුවත්, 2022 වර්ෂයේ වාර්තාව 2024 මැයි 31 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.	2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ පරිවර්තන කටයුතු අවසන් අදියරේ පවතින අතර අවසන් වූ වහාම ඉදිරිපත් කිරීමට නියමිතයි.	රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2.3 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ගෙවීම නිශ්චිතව තහවුරු කර නොගෙන ඉදිකිරීම් කාර්යයන් සඳහා රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු. 2,251,226 ක් වටිනා වෙක්පත් 2 ක් 2020 වර්ෂයේ සිට පොදු තැන්පත් ගිණුමට තැන්පත් කරමින් ඒවා රික් විසිෂන් පත්‍ර මඟින් 2023 දෙසැම්බර් 31 දින වන විට පොදු තැන්පත් ගිණුමෙන් ඉවත් කර චෙක්පත් ලියා අත රඳවා ගෙන තිබුණි	රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු නිර්දේශය මත එවන ලද ලේඛණ පදනම් කරගෙන වියදම් සහතික කර චෙක්පත් ලියන ලදී. එහෙත් මෙම ඉදිකිරීම් සම්බන්ධව බොහෝ ගැටළු පැවති අතර විවිධ විවේචනද එල්ල වූ බැවින් චෙක්පත් නිකුත් නොකර ඉදිරිපත් කල මිනුම් වාර්තා නැවත පරීක්ෂා කල අතර එහිදී ඔවුන් විසින් ඉදිරිපත් කරන ලද මිනුම් පත්‍ර වල පැවති නොගැලපීම් හේතුවෙන් සම්පූර්ණ ඉදිකිරීමට අදාළ අනුමැතිය ලබා ගන්නා තෙක් ගෙවීම් නොකර චෙක්පත් තවදුරටත් රඳවා ගැනීමට තීරණය කරන ලදී.	ගෙවීම නිශ්චිතව තහවුරු කරගෙන චෙක්පත් ලිවීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලැසුම් කිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ මාර්ගෝපදේශ අංක 12 අනුව ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් වියයුතු ක්‍රියාත්මක කාල රාමුව හා අපේක්ෂිත නිමවුම්/ ප්‍රතිඵල (output/outcome), අභ්‍යන්තර විගණන සැලැස්ම ආදී තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.	2023 වර්ෂයේ ක්‍රියාත්මක කාලරාමුව කාර්තු වශයෙන් සකස් කර තිබුණි. ඇතැම් කාර්යයන් සඳහා අතපසුවීමකින් අපේක්ෂිත නිමවුම/ ප්‍රතිපල දක්වා නැත. 2023 වර්ෂයේ මද භාගයේදී අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කර ඇත. 2024 වර්ෂයේ මෙම කරුණු නිවැරදිව කටයුතු කර ඇත.	චක්‍රලේඛය ප්‍රකාරව සියළු කරුණු ඇතුලත් කර ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළ යුතුය.

3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් 37 ක් ඉටුකර ගැනීමට අපොහොසත් වී තිබුණි. දෙපාර්තමේන්තුව	අදාළ නිලධාරීන්ගේ උපදෙස් නොලැබීම, වියදම් පාලනය කිරීම වෙනුවෙන් නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් සුදුසුකම් සහිත කාර්යමණ්ඩලයක් නොමැති වීම යන කරුණු හේතුවෙන් තාවකාලිකව නතර කර ඇත.	ප්‍රයෝගික තත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර එයට ඇතුලත් කළ සියලු කාර්යයන් ඉටු කල යුතුය.

3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ක්‍රියාකාරකම් 23 ක කාර්යය සාධනය සියයට 50 ක අවම මට්ටමක භෞතික ප්‍රගතියක් අත් කර ගෙන තිබුණි. එක් ක්‍රියාකාරකමක මූල්‍ය ප්‍රගතිය සියයට 99 ක්පැවතියද කිසිදු භෞතික ප්‍රගතියක් ලබා ගෙන නොතිබුණි.	මුදල් ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය විසින් වියදම් පාලනය කිරීම වෙනුවෙන් නිකුත් කරන ලද අයවැය චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම හා මානව සම්පත ප්‍රමාණවත් නොවීම.	ප්‍රයෝගික තත්වයන් සලකා බලා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර එයට ඇතුලත් කළ සියලු කාර්යයන් ඉටු කල යුතුය.

3.4 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සියලුම ගණන් දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර නියමිත ආකෘතියේ සකස් කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරී අනුමැතිය ලබාගෙන ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතු වුවත් 2023 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම 2023 ජූලි 14 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සියලුම ගණන් දීමේ නිලධාරීන් විසින් තම ආයතනයට පැවරී ඇති විෂයන් හා කාර්යයන් අනුව ඉදිරි වර්ෂයේ පුනරාවර්තන හා ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රවර්තන වර්ෂයේ දෙසැම්බර් 10 දිනට පෙර නියමිත ආකෘතියේ සකස් කර ප්‍රධාන ගණන් දීමේ නිලධාරී අනුමැතිය ලබාගෙන ප්‍රසම්පාදන කොමිෂන් සභාව, විගණකාධිපති සහ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමුකළ යුතු වුවත් 2023 වර්ෂයට අදාළ ප්‍රසම්පාදන සැලැස්ම 2023 ජූලි 14 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය
(ආ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය ප්‍රකාරව අවම වශයෙන් වර්ෂ 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ලැයිස්තුගත කර ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම සකස් කළ	එකඟ වේ. ඉදිරි වර්ෂයේදි නිවැරදි කිරීමට කටයුතු කිරීමට අපදෙස් ලබා දෙන ලදි.	ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම හා වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව පිළියෙල කළ යුතුය.

යුතු අතර වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන සැලැස්ම විස්තරාත්මකව පිළියෙල කළ යුතුය. නමුත් දෙපාර්තමේන්තුව සකස් කළ 2023 වර්ෂය සඳහා පමණක් සකස් කළ එකක් විය. ඒ හේතුවෙන් ප්‍රසම්පාදන සැලැස්මෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ඇ) 2021 ජූලි 28 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2021 හි 2.3(අ) I ඡේදය ප්‍රකාරව නව ගොඩනැගිලි ඉදිකිරීම තාවකාලිකව අත්හිටුවා තිබියදී රු. 3,799,932 කට (වැට් රහිත) වැසැකිලි පද්ධතියක් ඉදිකිරීමට කටයුතු කර තිබුණි. එහිදී උපදේශක ආයතනය හා කොන්ත්‍රාත් ආයතනය තෝරා ගැනීම සඳහා නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලීන් අනුගමනය කර නොතිබුණි. උපදේශක ආයතනයේ ඉදිකිරීම් පිළිබඳ සැලසුම්, පිරිවිතර, ප්‍රමාණ පත්‍ර හා ගෙවීම් වාර්තා සකස් කිරීමේ අඩුපාඩු පැවතීම හේතුවෙන් එම උපදේශක ආයතනයේ සේවාව ලබා ගැනීම අත්හිටුවා ඉතිරි කොටස් සඳහා වෙනත් ආයතනයකින් රු. 2,084,081 කට (වැට් රහිත) මුදලකට උපදේශන සේවාව ලබාගැනීමට තීරණය කර තිබුණි. එමෙන්ම කොන්ත්‍රාත් ආයතනයේ අඩුපාඩු ද නිරීක්ෂණය වී තිබුණු අතර 2024 අප්‍රේල් 30 දින වන විට රු. 1,649,401 ක් ගෙවා තිබුණද ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි.

මෙම වැසිකිලි පද්ධතියට අදාළ BOQ සකස් කිරීම සඳහා වෘත්තීය තාක්ෂණික නිලධාරියෙකු මෙම දෙපාර්තමේන්තුව තුළ නොමැති බැවින් එවකට මාධ්‍ය සංවර්ධන මධ්‍යස්ථාන ගොඩනැගිල්ල නවිකරණ කටයුතු සඳහා උපදේශන සේවා සැපයූ ආයතනයේ සේවාව ලබා ගැනීමට ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතියට යටත්ව කටයුතු කර ඇති බව දන්වා තිබුණි. මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් විවිධ ගැටළු සහ විවේචනයන් ඉදිරිපත් කර තිබූ අතර එම ගැටළු හා විවේචන විසඳා ගැනීම සඳහා ඒකාබද්ධ කමිටු රැස්වීම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුණි.

රජයේ ප්‍රසම්පාදන මාර්ගොපදේශ ප්‍රකාරව කටයුතුකළ යුතුය.

3.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ගුණාත්මක තත්ත්වයෙන් යුතු චිත්‍රපට නිපදවීමේ අරමුණින් 1999 දෙසැම්බර් 10 දින Debri යන ආයතනය හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සග එළඹී ගිවිසුමට අනුව ප්‍රංශ රජයෙන් ලැබුණ ණය ආධාර යටතේ ප්‍රංශ ෆ්‍රෑන්ක් 9,150,000 (යූරෝ 1,442,601) කට සමාන රු. මිලියන 102.2 කට 2023 වර්ෂයේදී ස්ථාපනය කර තිබූ රසායනාගාර යන්ත්‍රෝපකරණ කට්ටලය ගෙන්වීමේදී නිසි පරිදි ශබ්‍යතා අධ්‍යනයක් සිදු කර නොතිබීම හේතුවෙන් 2024 අප්‍රේල් 30 දින දක්වාම නිශ්කාර්යව පැවතුණි. මෙම යන්ත්‍රෝපකරණ කට්ටලය ස්ථාපිත කර තැබීම සඳහා දෙපාර්තමේන්තුවේ විශාල භූමි ප්‍රමාණයක ගොඩනැගිල්ලක් භාවිතයට ගැනීමෙන් එම ගොඩනැගිල්ල ද ඌන උපයෝජිත වත්කමක් බවට පත් වී ඇත. තවද මෙම රසායනාගාර ගොඩනැගිල්ල තුළ දිර්ඝකාලීනව භාවිතයට නොගන්නා වත්කම් අයිතම 85 ක් නිශ්කාර්යව පැවතුණි.	මෙම යන්ත්‍රයේ තාක්ෂණය යල් පැන ගොස් ඇති නිසා ඉදිරියේ දී භාවිතයට ගැනීමට අපේක්ෂා නොකරයි. මේ බව දන්වමින් මුදල් අමාත්‍යාංශය වෙත උපදෙස් සඳහා යොමු කළ අතර මේ සඳහා විශේෂඥ දැනුමක් සහිත පුද්ගයන් ද ඇතුළත්ව තුන් දෙනෙකුට නොඅඩු කමිටුවක් පත් කර පුර්ණ විමර්ශනයක් සිදු කර Debri රසායනාගාර යන්ත්‍රෝපකරණ කට්ටලය සම්බන්ධයෙන් ගත හැකි විකල්ප ක්‍රියාමාර්ග මොනවාද යන්න දන්වන ලෙස කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය මගින් දැනුම් දී ඇත.	වත්කම් නිශ්කාර්යව නොතබා ප්‍රයෝජනයට ගැනීමට වගකිව යුතු නිලධාරීන් කටයුතු කළ යුතුය.
(ආ)	2021 දෙසැම්බර් 31 දිනට සිදු කළ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ ඌනතා වර්ග 12 ක් සඳහා යෝජිත ක්‍රියාමාර්ගය ලෙස විමර්ශනයක් සිදු කළ යුතු බව දක්වා තිබුණ ද මෙම ඌනතා සම්බන්ධයෙන් 2021 වර්ෂයේ සිට මේ දක්වා නිසි ක්‍රියාමාර්ග ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.	2021 භාණ්ඩ සමීක්ෂණයට අදාළව හඳුනාගෙන ඇති සියලු ඌනතා හා අතිරික්තා 2023 භාණ්ඩ සමීක්ෂණයට සමගාමීව නිරවුල් කෙරෙමින් පවති.	ඌනතා සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.6 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 වර්ෂය තුළදී වාහන අනතුරු 04 ක රු.223 300 ක අලාභයක් තක්සේරු කර තිබුණු අතර ඉන් රු.93,500 ක් අයකර ගත නොහැකි වී තිබුණි.	19 – 7483 වාහනයේ අධිකරණ කටයුතු අවසන් නොවීම නිසා ඊට අදාළ අලාභය පියවා ගැනීමද ප්‍රමාද වී ඇත.	වගකිව යුතු පාර්ශවයන්ගෙන් අලාභය අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	දෙපාර්තමේන්තු ගබඩාව තුළ 2023 දෙසැම්බර් 31 දින වන විට දෙසතිය සඟරා 73,167 ක් අලෙවි නොවී ගබඩා කර තිබූ අතර එහි විකුනුම් වටිනාකම රු.4,099,620 ක් විය.	වාර්ෂිකව ඉතිරිවන සඟරා රජය විසින් පවත්වනු ලබන උත්සව හා වෙනත් රාජ්‍ය කයයුතුවලදී විකිණීම සාමාන්‍යයෙන් සිදුවන අතර ජනතාව වෙත නොමිලේද ලබා දී ඇත. අලෙවි නොවී ඇති බවට සඳහන් කර ඇති සඟරා වසර 12ක පමණ කාලයක සිට එකතු වී ඇති සඟරා වේ.	ඉතිරි තොගවල කාලීන බව සලකා ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.

4. තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

විගණන නිරීක්ෂණය	ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම	නිර්දේශය
තිරසාර සංවර්ධන අරමුණු 3 ක් හඳුනාගෙන තිබුණද ඒවා ලඟාකර ගැනීමට අවශ්‍ය සම්පත් හා ධාරිතාවයන් අඛන්ඩව ලබා ගැනීමට නොහැකි වීමේ අවදානම හඳුනාගැනීම, එම අවදානම් අවම කිරීමට ගතයුතු පියවරයන් වශයෙන් නිසි ක්‍රම සම්පාදන සැලැස්මක් සකස් කිරීම, නිලධාරීන් දැනුවත් කිරීමහා අවශ්‍ය පිළියම් හා තීරණ ක්‍රියාත්මක කිරීම යනාදිය සඳහා කමිටුවක් පත් කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි.	තිරසාර සංවර්ධන අරමුණු සම්බන්ධ කටයුතු කිරීමට කමිටුවක් පත් කර ඇත.	හඳුනාගත් තිරසාර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීමට අවශ්‍ය කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කළ යුතුය.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 දෙසැම්බර් 24 දිනැති අංක DMA/01 – 2019(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව සෑම වර්ෂයකම දෙසැම්බර් 15 දිනට පෙර ඉදිරි වර්ෂය සඳහා වන අභ්‍යන්තර විගණන සැලැස්ම, අවදානම් පාදක අභ්‍යන්තර විගණන සැලැස්මක් ලෙස පිළියෙල කර එහි පිටපත් කලමණාකරන විගණන දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් 2023 වර්ෂයේ අභ්‍යන්තර විගණන සැලැස්ම 2023 නොවැම්බර් 27 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබූ අතර 2023 අප්‍රේල් 03 දින සිට අභ්‍යන්තර විගණකවරයෙකු පත් කිරීමෙන් පසු 2023 ජූනි 14 දින සුදුසු සහාය නිලධාරීන් පත් කර අභ්‍යන්තර විගණන ඒකකය පිහිටුවන ලදී එම නිසා අවසන් කාර්තුව සඳා විගණන සැලැස්ම සකස් කර ඉදිරිපත් කරන ලදී.	කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	2023 අප්‍රෙල් 03 දින දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගකවරයෙකු පත්කර තිබුණද 2023 වර්ෂයේදී අභ්‍යන්තර විගණන කටයුතු වල ප්‍රගතිය සියයට 14 ක්වූ අවම මට්ටමක පැවතුණි.	2023 අප්‍රෙල් 03 දින සිට අභ්‍යන්තර විගණකද, 2023 ජූනි 14 දින සහාය නිලධාරීන්ද පත් කළත් දෙපාර්තමේන්තුවේ ආයතන ව්‍යුහය , ආයතන ක්‍රමවේදයන්, අභ්‍යන්තර පාලන ක්‍රමයන් බහා කාර්යපථයන් විශ්ලේශනය කිරීම හා විමර්ශනය කිරීම සඳහා කාලයක් කැප කිරීමට සිදුවීම නිසා එම කාලය තුළ අභ්‍යන්තර විගණන වාර්තා නිකුත් කිරීමට නොහැකි විය.	විගණන කටයුතු වල ප්‍රගතිය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය.

6. මානව සම්පත් කළමණාකරනය

විගණන නිරීක්ෂණය	ගණන් දීමේ නිලධාරීන්ගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයට අවසානයට ජ්‍යෙෂ්ඨ මට්ටමේ , තෘතීය මට්ටමේ ද්විතීය මට්ටමේ ,හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 121 ක් පැවති අතර එම තත්වය හේතුවෙන් ඵලදායී සේවා මට්ටමක් පවත්වා ගැනීම සඳහා එය බලපා තිබුණි.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 මඟින් රජයේ වියදම් පාලනය කිරීම යටතේ බඳවා ගැනීම තාවකාලික කල් තබන ලෙස උපදෙස් ලබා දී ඇති බැවින්, තනතුරු වලට නිලධාරීන් බඳවා ගැනීම දැනුම් දෙන තෙක් කල් තබා ඇත.	ඵලදායි සේවාවක් පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම්		
	100%- 90%	89%-51%	50% - 10%
වාර්තා චිත්‍රපට, සාකච්ඡාමය වැඩසටහන් හා කෙටි වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය	96%	-	-
ප්‍රවෘත්ති ආවරණ	-	59%	-
කැබිනට් මාධ්‍ය ප්‍රකාශය සජීවී පටිගත කිරීම / ප්‍රවාහය / සංඥා භාෂා නිෂ්පාදනය / ශ්‍රව්‍ය දෘශ්‍ය සැකසුම්		-	38%
රජයේ වීඩියෝ දැන්වීම් නිෂ්පාදනය	-	-	20%
GFU YouTube වෙබ් අඩවිය සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් වෙබ් අඩවි හරහා වාර්තා චිත්‍රපට විකාශනය කිරීම	96%	-	-
FGU YouTube නාලිකාව සහ Facebook පිටුව නැවත ආරම්භ කිරීම	100%		
ප්‍රවෘත්ති / සිදුවීම් ඡායාරූප මගින් ආවරණය	-	-	30%
ඡායාරූප පුස්තකාලයේ පැරණි ඡායාරූප නෙගටිව් ස්කෑන් කිරීම (ඡායාරූප සංරක්ෂණය)	98%	-	-
ඩිජිටල් ඡායාරූප ආවරණ ඡායාරූප පුස්තකාලයේ ගබඩා කිරීම	-	82%	-
ඡායාරූප පුස්තකාලයේ ස්ථිර උපස්ථ වෙත සියලුම ඡායාරූප සුරැකීම	113%	-	-
ඩිජිටල් තාක්ෂණය යටතේ රජයේ චිත්‍රපට අංශය සතු වාර්තා සහ ප්‍රවෘත්ති චිත්‍රපට සංරක්ෂණයට අදාළ චිත්‍රපට කෝණ පිරිසිදු කිරීම සහ ඩිජිටල් මාධ්‍ය බවට පරිවර්තනය කිරීම සඳහා තත්ත්ව පරීක්ෂණ අලුත්වැඩියා කිරීමේ ක්‍රියාවලිය පවත්වාගෙන යාම	-	70%	-
විශ්ව විද්‍යාල ශිෂ්‍ය පර්යේෂණ නිබන්ධන සඳහා, දෙපාර්තමේන්තු පුහුණුව ලබන විශ්ව විද්‍යාල සිසුන් සහ ක්ෂේත්‍රයට පැමිණෙන පාසල් සිසුන් සඳහා අවශ්‍ය නිදර්ශන සහ ප්‍රායෝගික පුහුණු සැපයීම	-	58%	-
දෙසතිය සඟරාව පළ කිරීම	100%		
දෙසතිය සඟරාව අලෙවිය	-	-	44%

පනත් සහ ගැසට් අලෙවිය	104%	-	-
දෙසතිය යෙදුම් මෘදුකාංගය සංවර්ධනය	-	80%	-
ප්‍රවෘත්ති සහ මාධ්‍ය නිවේදන www.dgi.gov.lk වෙත උඩුගත කිරීම	100%	-	-
සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් මාධ්‍ය සංචාර සංවිධානය කිරීම	-	55%	-
රජයේ නිල මාධ්‍ය නිවේදන නිකුත් කිරීම	100%	-	-
අන්තර්ජාතික මාධ්‍ය සම්මන්ත්‍රණ සංවිධානය කිරීම	-	60%	-
සතිපතා මාධ්‍ය විශ්ලේෂණ වාර්තා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් සකස් කිරීම	-	80%	-
පාසල් සිසුන් සහ ගුරුවරුන් සඳහා මාසිකව දේශන පැවැත්වීම	-	83%	-
පොත් කට්ටල සහ බිත්ති පුවත්පත් 100 බැගින් පාසල්වලට බෙදා හැරීම	100%	-	-
පාසල් සිසුන් සඳහා කෙටි කතා තරඟයක් සංවිධානය කිරීම	-	80%	-
කෙටි චිත්‍රපට තරඟයක් පාසල් සිසුන් සඳහා පැවැත්වීම	-	80%	-
පාසල් ගුරුවරුන් 500ක් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම	-	-	40%
ජාතික මාධ්‍ය සංකථන කෘතියේ වෙළුම් 02ක් ප්‍රකාශයට පත් කිරීම	95%	-	-
පාසල් මාධ්‍ය සමාජ සඳහා E-NewsPaper ප්‍රකාශයට පත් කිරීම	-	80%	-
පොලිස් සහ ත්‍රිවිධ හමුදා නිලධාරීන් වෙනුවෙන් කෙටිකාලීන පාඨමාලා 04ක් සංවිධානය කිරීම	100%	-	-
කැබිනට් තීරණ දැනුම් දීමේ ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය කිරීම	-	71.15%	-
රජයේ විශේෂිත වැඩසටහන් පිළිබඳව ප්‍රවෘත්ති සාකච්ඡා සංවිධානය සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා ප්‍රචාරණ කටයුතු ක්‍රියාත්මක කිරීම	-	88%	-
වෙනත් ආයතනයන්හි පවත්වන ප්‍රවෘත්ති සාකච්ඡා සම්බන්ධීකරණය	100%	-	-
නිල ප්‍රවෘත්ති නිවේදන මාධ්‍ය වෙත නිකුත් කිරීම	99.5%	-	-
රජයේ සංවර්ධන වැඩසටහන් සම්බන්ධයෙන් මාධ්‍ය නිරීක්ෂණ චාරිකා සංවිධානය කිරීම	-	-	54.54%
මාධ්‍ය ආවරණ සම්බන්ධීකරණය	94%	-	-
වෙනත් ප්‍රවෘත්ති නිවේදන	96.5%	-	-
ජාතික උත්සව, වැඩමුළු හා මාධ්‍ය සම්මන්ත්‍රණ ඇතුළු විශේෂිත වැඩසටහන්	100%	-	-
විශේෂිත වාර්තා සකස් කිරීම	100%	-	-

දිස්ත්‍රික් මට්ටමින් ප්‍රවෘත්ති නිකුත් කිරීම	100%	-	-
විශේෂාංග ලිපි නිකුත් කිරීම	-	86.4%	-
දුරකථන නාමාවලි සකස් කිරීම	100%	-	-
විශේෂිත අවස්ථාවලදී වාර්තාංග චිත්‍රපට දිස්ත්‍රික් මාධ්‍ය ඒකක මගින් ප්‍රදර්ශනය කිරීම	-	-	50%
ප්‍රාදේශීය මාධ්‍යවේදීන්ගේ නාමලේඛන යාවත්කාලීන කිරීම	100%	-	-
ප්‍රාදේශීය ප්‍රවෘත්ති ෆේස්බුක් පිටුව වෙත ඇතුළත් කිරීම	100%	-	-
මාධ්‍ය ඒකක නිලධාරින්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම	-	-	20%
රජයේ නිල පුවත් වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම (Uploading news and current affairs)	101%	-	-
Twitter සමාජ මාධ්‍ය ජාලය යාවත් කාලීන කිරීම	101%	-	-
Visual programs in YouTube & Twitter	101%	-	-
Facebook සමාජ මාධ්‍ය ජාලය යාවත්කාලීන කිරීම	142.5%	-	-
ජනතාව වෙත නිල නිල තොරතුරු සන්නිවේදනය	99%	-	-
විවිධ විෂයන් යටතේ ශාස්ත්‍රීය දේශන පැවැත්වීම.	100%	-	-
මාධ්‍යවේදීන් සඳහා එක්දින වැඩමුළුවක් සංවිධානය කිරීම.	-	80%	-
විශේෂාංග ලිපි සැකසීම.	-	77%	-
පාලන අංශය සහ ගිණුම් අංශයේ නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම.	167%	-	-
දෙපාර්තමේන්තුවේ තෙත්‍ර භාෂා වෙබ් පිටුවට සංවර්ධන පුවත් උඩුගත (Upload) කිරීම.	101%	-	-
රජයේ විශේෂ ව්‍යාපෘති සහ සංවර්ධන පුවත් පිළිබඳ මාධ්‍ය සාකච්ඡා පැවැත්වීම.	-	88%	-
මාධ්‍ය ප්‍රකාශ / නිවේදන නිකුත් කිරීම.	97%	-	-
"විශේෂ සංවර්ධන" වැඩසටහන් සඳහා ප්‍රචාරණ ලබාදීම.	100%	-	-
ශ්‍රී ලාංකීය අනන්‍යතාවය සහ ජාතිය අවශ්‍යතා වර්ධනය ප්‍රවර්ධනය කිරීම (සහරා)	-	-	35%

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/ අරමුණ	ඉලක්ක (ගෝලීය ඉලක්කය)	සාක්ෂාත් කර ගැනීම සඳහා වන දර්ශක	වර්තමානය වන විට සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
නිරෝගී ජීවිතයක් තහවුරු කිරීම හා සියලු දෙනාට, සෑම වයසකදීම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම **(SDG 03)**	නිරෝගී බව සහ යහපැවැත්ම පවත්වා ගැනීම	"නිවැරදිව ආහාර තෝරා ගනිමු", කාලීන සෞඛ්‍ය ගැටළු යන මාතෘකා යටතේ මහජන සෞඛ්‍ය සේවා පරීක්ෂකවරුන් හා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ සහභාගීත්වයෙන් DGI Talk නමින් සාකච්ඡාමය වැඩසටහන් නිෂ්පාදනය කර ඇත.	-	-	**80%**
සමාන හා අන්තර්ග්‍රහණීය වූ අධ්‍යාපනයක් ලැබීම තහවුරු කිරීම හා සැමට ජීවිත කාලය පුරා අධ්‍යාපනය ලැබීමේ අවස්ථා ප්‍රවර්ධනය කිරීම **(SDG 04)**	විශ්ව විද්‍යාල ශිෂ්‍යයින් සඳහා ආධුනිකත්ව පුහුණු අවස්ථා ලබා දීම.	වසර තුළදී ආධුනිකත්ව පුහුණු අවස්ථා 15 ක් ලබා දීම	-	-	**86.6%**

	දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා පුහුණු අවස්ථා ලබා දීම.	එක් නිලධාරියෙකුට අවම පැය 12ක් වත් වන පරිදි පුහුණු අවස්ථා ලබා දීම	**40%**	-	-
ස්ත්‍රී පුරුෂ සමාජභාවය අත්කර ගැනීම සහ කාන්තාවන් හා ගැහැණු ළමයින් බලගැන්වීම **(SDG 05)**	අනාගත මාධ්‍ය වෘත්තීන්හි කාන්තා දායකත්වය ඉහළ නැංවීම සඳහා පාසල් මාධ්‍ය සමාජ තුළ ශිෂ්‍යාවන් සවිබල ගැන්වීම	පාසල් මාධ්‍ය සමාජවල ශිෂ්‍යාවන් සවිබල ගැන්වීම සඳහා වන ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම.	-	-	**80%**

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ:

1. නිවැරදිව ආහාර තෝරා ගනිමු, කාලීන සෞඛ්‍ය ගැටළු යන මාතෘකා යටතේ මහජනතාව දැනුවත් කිරීම සඳහා DGI Talk නමින් සාකච්ඡාමය වැඩසටහන් නිෂ්පාදනය කර තිබීම
2. අන්තර්ජාතික කාන්තා දිනය නිමිත්තෙන් වාර්තා චිත්‍රපටයක් නිෂ්පාදනය කර තිබීම
3. "ව්‍යවසායකයින් බිහි කරමු" නමින් වාර්තා වැඩසටහන් මාලාවක් නිෂ්පාදනය කර තිබීම.
4. "සයුරින් නැගෙන නගරය" නමින් කොළඹ වරාය නගරය පිළිබඳව වාර්තා චිත්‍රපටයක් නිෂ්පාදනය කර රූපවාහිනී නාලිකා විකාශනය කර ඇත.
5. ශ්‍රී ලාංකීය මතවාද ලෝකය තුල ප්‍රවර්ධනය කිරීම සඳහා සඟරාවක් ප්‍රකාශයට පත් කිරීම.
8. ගුරුවරුන්ගේ සහ සිදුන්ගේ මාධ්‍ය සාක්ෂරතාවය සහ වෘත්තීය දැනුම වැඩිදියුණු කිරීම සඳහා මාස 06 ක පාඨමාලාවක් සංවිධානය කිරීම.
9. සිංහල හා දෙමල මාධයෙන් ගුරුවරුන් සහ සිසුන්ගේ මාධ්‍ය සාක්ෂරතාවය සහ වෘත්තීය දැනුම වැඩිදියුණු කිරීම සඳහා දිස්ත්‍රික්ක මාධ්‍ය වැඩමුළු සහ සම්මන්ත්‍රණ සංවිධානය කිරීම.
10. පාසල් මාධ්‍ය සමාජවල ශිෂ්‍යාවන් සවිබල ගැන්වීම සඳහා වන ව්‍යාපෘති යෝජනාව සකස් කිරීම.

❖ **අභියෝග:**

1. තිරසර සංවර්ධන ඉලක්ක ලගාකර ගැනීමට අවශ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් තරම් ප්‍රතිපාදන නොලැබීම.
2. කලින් කලට රජය මගින් විවිධ චක්‍රලේඛ මගින් ප්‍රතිපාදන සහ වියදම් සීමා කිරීම නිසා හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට බාධා පැමිණීම.
3. තිරසර සංවර්ධන ඉලක්ක ලගා කර ගැනීම සඳහා පෞද්ගලික මාධ්‍ය ආයතන දායක කර ගැනීම.
4. තාක්ෂණයේ ප්‍රගමනයත් සමඟ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නව තාක්ෂණයන් යොදා ගැනීම.
5. අන්තර්ජාතික මට්ටමේ මාධ්‍ය වෘත්තිකයන් බිහි කිරීම.
6. රාජ්‍ය මෙන්ම පෞද්ගලික අංශය සමඟ ගුණාත්මක මාධ්‍ය සංස්කෘතියක් බිහි කිරීම.

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු	අතිරික්ත
ජ්‍යෙෂ්ඨ	18	09	09	0
තෘතීයික	16	01	15	0
ද්විතියික	243	157	86	0
ප්‍රාථමික	53	42	14	0
එකතුව	330	209	121	0

* 2023.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූව ද ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයෙන් පැමිණි නිලධාරීන් 40 ක් සහ 2022 සංවර්ධන නිලධාරී පත්වීම් ලද නිලධාරීන් 70ක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවාවන්හි නිරත වේ.

අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් නොවූ නිලධාරීන්

ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයෙන් පැමිණි නිලධාරීන්	40
2022 සංවර්ධන නිලධාරී පත්වීම් ලද නිලධාරීන්	70
එකතුව	110

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

තෘතීයික මට්ටමේ සහ ද්විතියික මට්ටමේ මානව සම්පත් හිඟය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උදෙසා සෘජුවම බලපා ඇත. විශේෂයෙන් තාක්ෂණික කාර්යභාරය ඉටු කරන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් දෛනික රාජකාරී කටයුතු ඉටු කර ගැනීමේදී අපහසුතාවයක් පවතී. ඒ සඳහා දෙපාර්තමේන්තුගත තනතුරුවල සේවයේ යෙදී සිටි දැනුම සහ කුසලතාවයෙන් යුතු නිලධාරීන් විශ්‍රාම යාම ප්‍රධානම හේතුව වී ඇත. නවක නිලධාරීන්ට එම පුහුණුව ලබා දීමට විශාල කාලයක් ගත වනු ඇත. එසේම එම තනතුරුවල පුරප්පාඩු සඳහා උසස්වීම් ලබා දීමට ඇති බාධා හේතුවෙන් ද මේවන විට විවිධ මට්ටම්වල තනතුරු සඳහා නිලධාරී හිඟයක් ඇති වී තිබේ.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය /විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය	විදේශීය		
Graphic Designing	01	සති 20 සතියකට පැය03 හෝ06ක් දක්වා 2023.03.01 පසුව	රු.15,000.00		දේශීය	
රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව	02	මාස 06 2023.03.11	රු.49,650.00		දේශීය	
Advance Certificate in Public Procurement and asset managment	01	2023.05.17 දින සිට සෑම බදාදා දිනකම සිට දින 10 ක්	රු.22,500.00		දේශීය	
විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම	03	2023 ජුනි 08,15 හා 22	රු.45,000.00		දේශීය	
හානි පාඩු හා මු.රෙ 104 යටතේ වූ පරීක්ෂණය	04	2023 ජූලි 27	රු.20,000.00		දේශීය	

රජයේ වාහන නඩත්තු	02	2023 අගෝස්තු 23	රු.10,000.00		දේශීය	
නව විගණන පණත හා විගණන ගැටළු නිරාකරණය කිරීම	01	2023 සැප්තැම්බර් 18	රු.6,000.00		දේශීය	
විනයකාර්ය පටිපාටි	02	2023 සැප්තැම්බර් 22 හා 25	රු.19,000.00		දේශීය	
නිවාඩු ලිපිකරුවන්ගේ කාර්යභාරය හා වගකීම	02	2023 සැප්තැම්බර් 25 හා 26	රු.19,000		දෙශීය	
ප්‍රවාහන කළමනාකරණය	02	2023 ඔක්තෝබර් 30	රු.12,000.00		දේශීය	
පුද්ගලික ලිපි ගොනුවක් පවත්වා ගෙනයාම	02	2023 නොවැම්බර් 07 සහ 08	රු.19,000.00		දේශීය	
හානි පාඩු හා මු.රෙ.104 යටතේ වූ පරීක්ෂණය	02	2023 නොවැම්බර් 28	රු.10,000.00		දේශීය	

Salary Conversion	03	2023 නොවැම්බර් 30 සහ දෙසැම්බර් 14	රු. 28,500.00		දේශීය	
How to Prepare Procurement Plan	01	2023 දෙසැම්බර් 13 සහ 14	රු.9,500.00		දේශීය	
කාර්යාල කාර්ය සහයකින් සහ රියදුරන්ගේ ආකල්ප හා වෘත්තිය දැනුම ඉහල නැංවීම	03	2023 දෙසැම්බර් 13 සහ 14	රු.28,500.00		දේශීය	

6.4 ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායකත්වය

රාජ්‍ය සේවයට නවක පත්වීම් ලද නිලධාරීන් අනුයුක්ත කර සිටින අංශවලට හා පවරනු ලබන රාජකාරීවලට අදාළව බාහිර ආයතන මඟින් නිසි පුහුණුවක් ලබා දීම තුළින් තම රාජකාරී නිවැරදිව, ක්‍රමානුකූලව හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ඉටු කිරීමට හැකියාව ලැබෙනු ඇත.එසේම කාර්ය මණ්ඩල අභිප්‍රේරණයක් ළඟා කර ගැනීම මෙමඟින් අපේක්ෂිතය.

තවද මෙම පුහුණු පාඨමාලා තුළින් නිලධාරීන්ට රාජකාරී පරිසරයේ ඒකාකාරී බවින් මිදීමට, නව දැනුම උකහා ගැනීමට හා ඔවුන්ගේ හැකියාවන් වැඩිදියුණු කර ගැනීමට අවස්ථාව ලැබේ.

නිලධාරීන් පුහුණු පාඨමාලාවන්ට යොමු කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ නැංවීමට හැකියාව ලැබේ.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.6	වෙනත්	අදාළ නොවේ	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	රා.ගි.ව.අංක 271/2019 (මූල්‍ය ප්‍රකාශන - 2019) මඟින් තවදුරටත් එම ලේඛන පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය නොවන බව දන්වා ඇත	
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-

3.4	2014.05.11 දිනැති 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර අංශ / ඒකකවලින් පිළිතුරු ලබා දීමේදී ප්‍රමාදයන් සිදු වීම	ඉදිරියේදී නියමිත දිනට පිළිතුරු ලබාදෙන ලෙස අදාළ අංශ දැනුවත් කිරීම සහ අතුරු පිළිතුරු යැවීම

6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	රටේ පැවති අර්බුදකාරී තත්වය හේතුවෙන් නියමිත දිනට සිදු කළ නොහැකි විය	ඉදිරියේදී නියමිත පරිදි ඉටු කරනු ලැබේ
8	වත්කම් කළමනාකරණය			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ	-	-

8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී	
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතී	
9	වාහන කළමනාකරණය			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ	-	-
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	ඉන්ධන දහන පරීක්ෂණය සඳහා පත් කළ කමිටු නිලධාරීන් ස්ථානමාරු වීම සහ විදේශගත වීම නිසා කමිටුවේ වැඩ කටයුතු අවසන් කිරීමට නොහැකි විය. 2020/02/20 දින නැවත කමිටුව පත් කර පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇත.	2024 වසරේදී එම පරීක්ෂණය කිරීමට සැලසුම් කර ඇත.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහ ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අදාළ නොවේ	-	-
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ	රජයේ අත්‍යවශ්‍ය ප්‍රචාරන කටයුතු සිදු කිරීමට සිදු වීම හේතුවෙන් සමහර වැය විෂයයන් සඳහා ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදු විය. නමුත් සමස්ථ ප්‍රතිපාදන සීමාව ඉක්මවා නොමැත	වර්ෂ අවසාන ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීමට කටයුතු කිරීම
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ	-	-

12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් ඉල්ලා ඇත	නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතී
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ	-	-
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	
14	**අග්‍රීම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරිය අතුරු අග්‍රීම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ශේෂ මුදල් නොපමාව පියවීම සිදු කළද වවුචර්පත්වල අඩුපාඩු හේතුවෙන් අවසන් පියවීම ප්‍රමාද වීම	ඉදිරියේදී නිලධාරීන් දැනුවත් කර නිසියාකාරව වවුචර්පත් ඉදිරිපත් කිරීම

14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රීම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රීම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ	-	-
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල වේ	-	-

18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ	-	-
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ	-	-
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	-	ඉදිරියේදී ගිවිසුම් අත්සන් කර ගැනීමට කටයුතු කරනු ලැබේ

19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ	-	-
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල නොවේ	-	අදාළ විගණන ඡේද නිවැරදි කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී

❖ අවසානය

රාජ්‍ය ප්‍රතිපත්ති, රජයේ සංවර්ධන ක්‍රියාදාමය ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් සහ ජනතාව වෙනුවෙන් රජය මඟින් ඉටු කරනු ලබන කාර්යභාරය පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම හා කාර්යභාරය වන අතර වෙනස්වන ගෝලීය තාක්ෂණ ප්‍රවනතාවන්වලට අනුගත වෙමින් තොරතුරු තාක්ෂණ ක්‍රියාවලිය කළමනාකරණය කර, නිදහස් හා වගකිව යුතු උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීම සඳහා අනුබල දීම හා නායකත්වය සැපයීම ද ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

මෙකී කාර්යභාරය සාක්ෂාත් කරගනු වස් එනම්, යහපත් මාධ්‍ය සමාජයක් ගොඩනැඟීම සඳහා අවශ්‍ය වන්නා වූ පසුබිම ලාංකේය සමාජය තුළ ස්ථාපිත කිරීමට උපයෝගි කර ගනු ලබන ප්‍රතිපත්ති සැකසීම, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පාලනය, අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ රාජකාරීමය සම්බන්ධතා පවත්වාගෙන යාම ආදිය සඳහා දෙපාර්තමේන්තුව සිය කාර්යමණ්ඩලය මෙහෙයවන අතර එහිදී එකී නිලධාරීන්ට සිය වගකීම් ඉටු කර ගැනීමට අවශ්‍ය කරන දැනුම, හැකියාව හා පරිසරය සකස් කර දෙනු ලබයි.

මේ තුළ වැඩි අවධානයක් දෙපාර්තමේන්තුව පිහිටුවීමේ මූලික අරමුණු කෙරෙහි යොමු කෙරෙන අතර දෙපාර්තමේන්තුවේ සියලුම අංශ එකී අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිසම ක්‍රියාත්මක වේ.

රජයේ සංවර්ධන පුවත් ජනතාව වෙත සම්ප්‍රේෂණය කිරීමේ භූමිකාව මෙන්ම ඒ හා ඈදුනු තවත් අරමුණු සාක්ෂාත් කර ගනු වස් ක්‍රියාත්මක රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව, ඒ වෙනුවෙන් විවිධ ක්‍රියාකාරකම් සිය සැලසුම් තුළ අන්තර්ගත කර වසර මුලදී එකී සැලසුම් සඳහා අමාත්‍යාංශ අනුමැතිය ලබා ගනී.

ඉන් අනතුරුව වසර පුරා එකී සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රියාකාරකම්වල නිරත වන අතර එමඟින් සාක්ෂාත් කර ගැනීමට වෙර දරන අරමුණු මූලික වශයෙන් පහත පරිදි පෙළගැස්විය හැක.

- ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීම.
- තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන වැඩසටහන් වැඩපිළිවෙල පිළිබඳව තොරතුරු මහජනතාව වෙත ගෙන යාම.
- මාධ්‍ය විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම.
- යහපාලනය, සංහිඳියාව, තිරසාර සංවර්ධනය ස්ථාපිත කරමින් ප්‍රකාශනයේ හා භාෂණයේ නිදහස තහවුරු කිරීම.
- මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතු, සංවර්ධන හා සැලසුම් ඇති කිරීම.
- ඉහත අරමුණු සාක්ෂාත් කරගනු වස්, දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වර්ග කළ හැක.

- අනෙකුත් අමාත්‍යාංශ විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට අදාළ දැනුවත් කිරීමේ වැඩසටහන් (මාධ්‍යවේදීන්, පාසල් සිසුන්, මාධ්‍ය ලේකම්වරුන් හා අනෙකුත් පාර්ශව)
- මාධ්‍ය සාකච්ඡා සංවිධානය කිරීම (කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය සාකච්ඡාව හා වෙනත් අමාත්‍යාංශ හා ආයතන කාර්යභාරයට අදාළව)
- ප්‍රවෘත්ති නිවේදන නිකුත් කිරීම
- මාධ්‍ය නිරීක්ෂණ චාරිකා සංවිධානය කිරීම
- සංවර්ධන වැඩසටහන් පිළිබඳ ලිපි හා ප්‍රකාශන ප්‍රකාශයට පත් කිරීම
- නව මාධ්‍ය යොදාගෙන සංවර්ධන වැඩසටහන් පිළිබඳ ප්‍රචාරණය ලබා දීම (Face Book, You Tube, Twitter etc….)
- දෙස් - විදෙස් මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම
- දෛනික විමර්ශන වාර්තා සකස් කිරීම හා අවශ්‍යතාවය මත අදාළ අංශ දැනුවත් කිරීම
- කාලීන වශයෙන් වැදගත් මාතෘකා හා මාධ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවනතා සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම හා වාර්තා ඉදිරිපත් කිරීම.
- වාර්තා චිත්‍රපට නිෂ්පාදනය හා ප්‍රචාරය
- ජාතික උත්සව හා සංරක්ෂණය කළ යුතු අවස්ථාවන් ආවරණය හා එකී අවස්ථා ඡායාරූප ගැනීම හා සංරක්ෂණය.

රටේ උද්ගත වෙමින් තිබූ ආහාර හා ආර්ථික අර්බුදයට මුහුණදීමට ජනතාව සූදානම් කර තැබීම සඳහා රජය විසින් ක්‍රියාවට නැංවූ විවිධ වැඩසටහන් පිළිබඳව වාර්තා චිත්‍රපට / කෙටි වීඩියෝ පට / දැන්වීම් නිෂ්පාදනය කරමින් ජනතාව නිවැරදිව දැනුවත් කර තැබීම සඳහා කටයුතු කරන ලදී. ජාතික වශයෙන් වැදගත් සැමරුම් පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දැන්වීම්, වාර්තා චිත්‍රපට සහ ප්‍රචාරක පට නිෂ්පාදනය කරන ලදී (උදා - 76 වැනි ජාතික නිදහස් දින සැමරුම පිළිබඳව රූපවාහනී ප්‍රචාරකපට, සියවසට පියවරක් වාර්තා චිත්‍රපටය). ශ්‍රී ලංකාවේ ආර්ථිකය අර්බුදයට ලක්ව තිබූ මොහොතක අසල්වැසි හා හිතමිතුරු රාජ්‍යයන්ගෙන් ලැබුණු උදව් උපකාර හා ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව වාර්තා චිත්‍රපට මගින් ජනතාව දැනුවත් කරන ලදී. අර්බුදයට ලක්ව තිබූ සංචාරක කර්මාන්තය නැවත ඔසවා තැබීම සඳහා රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ වැඩසටහන්වලට සමගාමීව කෙටි වීඩියෝ වැඩසටහන් නිෂ්පාදනය කරමින් කටයුතු කරන ලදී. IMF ණය සහනය ලැබීම පිළිබඳව හා ඇමරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල ශක්තිමත් වීම පිළිබඳව කෙටි වාර්තා වැඩසටහන් නිෂ්පාදනය කර විකාශය කර ඇත.

75 වැනි නිදහස් දිනට පූර්වගාමීව පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 02ක් ප්‍රධාන කාර්යාලයේ නව ශ්‍රවනාගාරයේ සහ හෝමාගම මහින්ද රාජපක්ෂ විද්‍යාලයේ දී පැවැත්වුණි.

මෙලෙස විවිධාකාර භූමිකා හා අරමුණු ඔස්සේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව තම දෛනික රාජකාරී කටයුතු වඩා කාර්යක්ෂමතාවයෙන් සහ රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ඉටු කර ගැනීමට මනා පිටුබලයක් වෙමින් ඉදිරි වර්ෂය සඳහා ද ක්‍රියාත්මක වනු ඇත.

******